ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2026.07.20


01 වන්නිආරච්චිලාගේ අදීෂ උපශාන්ත මයා,
55/40, ශ්‍රී මහා විහාර පාර,
කළුබෝවිල,
දෙහිවල.

02 රෂා හසීනා මිය,
55/40, ශ්‍රී මහා විහාර පාර,
කළුබෝවිල,
දෙහිවල.

03 ලහිරු චතුරංග මයා,
55/40, ශ්‍රී මහා විහාර පාර,
කළුබෝවිල,
දෙහිවල.

**පැමිණිලිකරුවන්**

එදිරිව

**පැමිණිලි අංකය : එච්ආර්සී/4219/23**

01 **ප්‍ර.පො.ප. ඒ.ජේ.එම්. රංජන් සමරසිංහ මයා,**
හිටපු ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
කැස්බෑව.

02 ඔලබොඩුවගේ යසසිරි ගාමිනී අල්විස් මයා,
පො.සැ. 53175
පොලිස් ස්ථානය,
කැස්බෑව.

03 විතාරනගේ ප්‍රභාත් රන්දීර මයා,
පො.කො. 97522,
පොලිස් ස්ථානය,
කැස්බෑව.

04 විජේසූරිය ආරච්චිගේ සචිරු මධුශංක මයා,
පො.කො.රි. 98994,
පොලිස් ස්ථානය,
කැස්බෑව.

05 ගරුමුනි දනුෂිකා ගීතානි ද සොයිසා මිය,
කා.පො.කො.13067, පොලිස් ස්ථානය,
කැස්බෑව.

වගඋත්තරකරුවන්

**පැමිණිල්ල**

ඉහත නම් සඳහන් පැමිණිලිකරුවන් විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ පළමු පැමිණිලිකරු වන අදීෂ උපශාන්ත යන අය 2023.10.17 දින රාත්‍රී 2.00 – 3.00 අතර වේලාවේ ඔහු තාවකාලිකව පදිංචිව සිටි නිවස අසල තිබෙන නයිට් කඩයකට ගිය බවත් එම අවස්ථාවේ එකී කඩය අසල පොලිස් ජීප් රථයක් නවත්වා තිබූ අතර එම ජීප් රථය පසුකරගෙන කඩය ඇතුළට යාමට උත්සාහ කිරීමේදී පොලිස් ජීප් රිය තුළ සිටි පොලිස් නිලධාරියෙක් ඔහුට කතා කළ බවයි.

එසේ අඬගැසූ නිලධාරියාගේ නම මධුශංක බවට පසුව දැනගැනීමට ලැබුණු බවත් එම නිලධාරියා විසින් පැමිණිලිකරුගෙන් ජාතික හැඳුනුම්පත් තිබේද යනුවෙන් විමසා සිටි බවත් එම අවස්ථාවේදී ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කල බවත් ඉන් පසුව පැමිණිලිකරුගේ නම, ගම, රැකියාව යන සියලුම විස්තර විමසා සිටි බවත් ඒ සියල්ලටම ඔහු විසින් විස්තර ලබා දුන් අතර පැමිණිල්කරුගේ ජාතික හැඳුනුම්පතෙහි දෙහිවල ලෙස සඳහන්ව තිබෙන හේතුවෙන් ඔහු තාවකාලිකව කැස්බෑව 14 කණුව ඉදිරිපිට ඇති නිවසක පදිංචි වී සිටින බවට පැහැදිලි කළ බවත් ඉන් අනතුරුව කිසිදු හේතුවක් නොදන්වා ජාතික හැඳුනුම්පත ඉල්ලා සිටි නිලධාරියා විසින් ජීප් රථයට නැගීමට අණ කළ නමුත් එම දිනවල ප්‍රවෘත්ති හා සමාජ ජාලයන්හි පැහැරගෙන ගොස් අතුරුදහන් කිරීම්, අත්වැරදීම් වලින් මරණයට පත් කිරීම් වැනි දේ පොලීසිය පිළිබඳ කියවෙන බැවින් එකවර ඔහුට ජීප් රියට නැගීමට බිය සිතුන බවත් තවද හේතුවක් නොමැතිව ජීප් රියට නැගීමට නොහැකි බව නිලධාරීන්ට ඒ අවස්ථාවේ දැනුම් දුන් බවද වැඩිදුරටත් සඳහන් කර ඇත.

ඉන් පසුව එම නයිට් කඩයේ ඇති සීසීටීවී කැමරා ඉදිරිපිටට ගොස් ඔහුට යම්කිසි කරදරයක් ඇතිවේ යැයි සිතා භාර්යාවට දුරකථන මගින් දැනුම්දීමට උත්සාහ කළද පොලිස් නිලධාරීන් පැමිණ ඔහුගේ

දුරකථනය උදුරා ගත් බවත් එම අවස්ථාවේදී ද ඔහු විසින් අත්අඩංගුවට ගැනීමට හේතුව විමසා සිටි බවත් පසුව ඔහුගේ අතට මාංචු දැමීමෙන් අනතුරුව පොලිස් ජීප් රථය අසලට පොලිස් නිලධාරීන් සමග ඇවිදගෙන ගිය බවත් එම පොලිස් නිලධාරීන් විසින් ඔහුව බලහත්කාරයෙන් රදවා ගෙන එම ස්ථානයේදීම ඔහුට පහර දුන් බවත් "දෙහිවල පොලීසියට දාන වන්ඩි පාට් කැස්බෑවට දාන්න බෑ අද පෙන්වන්නම් කැස්බෑව පොලිසියේ හැටි " කියලා බලහත්කාරයෙන් ජීප් එකට නංවා ගත් බවත් තව දුරටත් දන්වා ඇත.

ජීප් රථයේ බිම වාඩි වෙන්න කියලා ජීප් රථයට නැග්ග අවස්ථාවේ සිට ඔහුට කම්මුලට සහ හිසට පිටුපස අසුනේ සිටි නිලධාරීන් දෙදෙනා විසින්ම පහර දුන් බවත් ඉදිරිපස අසුනේ සිටි දෙදෙනාද හැරි හැරී පහර දුන් බවත් ඔහුගේ කොන්ඩයෙන් ඇද වදහිංසා කරමින් කුඩු බොනවාද අයිස් ගහනවාද යනුවෙන් විමසා සිටි බවත්, ඔහුගේ වයස විමසා සිටි බවත් "කැස්බෑව පොලීසියට නොව උඹව අරගෙන යන්නේ මරන්න" කියලා තර්ජනය තළ බවත් දන්වා ඇත.

ජීප් රථයේ යන අතරතුර ඔහුගේ මාංචුව පිටුපසට මාරු කළ බවත් පොලිස් නිලධාරීන් පැවසූ ආකාරයට කැස්බෑව පොලීසියට නොගිය බවත් අඳුරු පිට්ටනියක් වැනි තැනකට සැහෙන දුරක් රැගෙන ගොස් පැමිණිලිකරුව එළියට බස්සවා තුවක්කුවක් එළියට දික්කරලා දණගසන ලෙසට තර්ජනය කළ බවත් ඔහුට ඇතිවූ බයට දණ ගැසූ බවත් " කැම්පස් කාරයෙක්ද අරගල කාරයෙක්ද කුඩු කාරයෝ උඹලා තමයි" යනුවෙන් බැණ වදිමින් අසභ්‍ය වචනද කියමින් අතින් පයින් පහර දුන් බවත් දෑත බැඳලා ටී-56 ගිණි අවියෙන් පහර දුන් බවත් තුවක්කුව ලෝඩ් කර මුහුණට තබා " කඩය ගාවදි ගත්තේ නැත්නම් අද උඹව මරලා කැස්බෑවෙන් පලයන් මෙහෙ ඉන්න එපා " යනුවෙන් තර්ජනය කළ බවත් ඔහුගේ මුහුණට ටෝච් එක අල්ලා ගෙන සිටි බවත් ජීප් එකේ තිබූ හෝස් බටය රැගෙන පිට්ටනියේදී ඔහුට හෝස් බටයෙනුත් පහර දුන් බවත් ඉන් පසුව මුහුණ බිමට සිටින ලෙස බිම දිගා කර පාගමින් දිගටම විනාඩි 5-10 ක් පහර දුන් බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

එම අවස්ථාවේ දී කිසිම වැරැද්දක් නොකර මෙසේ වදහිංසා කිරීමේදී ඔහුව මරා දමයි කියා ලොකු බයක් හා දුකක් ඇතිවූ බවත් එසේ පහර දෙන අවස්ථාවේදී කුඩු කාරයෙක්ද යනාදී ප්‍රශ්න ඔහුගෙන් විමසූ බවත් ඉන් පසුව ජීප් එකට දාගෙන යන අතර පොලිස් නිලධාරීන්ගේ භාරයේ තිබූ පැමිණිලිකරුගේ දුරකථනය අන්ලොක් කරන ලෙස ඉල්ලීමක් කළද ඔහු විවාහක පුද්ගලයෙකු බැවින් එකී දුරකථනයේ ඔහුගේ පෞද්ගලික විස්තර තිබෙන හේතුවෙන් එකී ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමේදී ජීප් රිය තුළ සිටි සිවිල් ඇඳුමින් සිටි නිලධාරියා විසින් තුවක්කුව ඔහුගේ දෙසට එල්ල කර ජීප් එක නැවත හරවා ගෙන අර පිට්ටනියට යන බවට තර්ජනය කර ඔහුගේ දුරකථනය ඔහු වෙතින්ම අන්ලොක් කර ගත් බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

කෙසේ වෙතත් දුරකථනය පරීක්ෂා කරන්න එපා කියද්දී දුරකථනය පරීක්ෂා කරමින් රියදුරු අසුනේ සිටි නිලධාරියා ඔහුගේ ගැලරියට ගොස් පුද්ගලික දේවල් ද පරීක්ෂා කළ බවත් ඉන් පසුව නැවත අර

පිට්ටනියට රැගෙන යන බවට තර්ජනය කිරීම හේතුවෙන් ඔහු අයිස් මත්ද්‍රව්‍ය භාවිතා කරන බවටත් නිවසේදී ද අයිස් මත්ද්‍රව්‍ය භාවිතා කරන වාරු කියන යාළුවෙක් සිටින බවට අසත්‍ය ප්‍රකාශයක් කළ බවත් එසේ අසත්‍ය ප්‍රකාශ කිරීමෙන් ඔහුගේ නිවසට යාමට සලස්වා නිවැසියන්ට ඔහුව බේරා ගැනීමට හැකියාවක් ඇති බවට විශ්වාස කළ බවත් දන්වා ඇත.

පසුව පොලිස් නිලධාරීන් සමග නිවසට ගිය බවත් නිවසට ලගා වීමෙන් අනතුරුව පැමිණිලිකරුව ජීප් රථයේ අල්විස් නිලධාරියා සමග රඳවා තබා තුවක්කුත් රැගෙන පොලිස් නිලධාරීන් විසින් පැමිණිලිකරුගේ නිවසට ඇතුල් වූ බවත් ටික වේලාවකින් පැමිණිලිකරුව ද නිවසට රැගෙන ගිය බවත් එම අවස්ථාවේ දී නිවසේ අයිතිකරු වන ලහිරු චතුරංග, පාසල් මිතුරෙකු වන චලන කවිෂ්ක සහ පැමිණිලිකරුගේ භාර්යාව යන තිදෙනාව පුටුවල හිදුවා තිබුනු බවත් ඔවුන් තිදෙනාගේම ජංගම දුරකථන අත්අඩංගුවට ගෙන තිබූ බවත් එම අවස්ථාවේදී ද ඔවුන්ට පහර දෙමින් බඩු පෙන්වන ලෙසට කියා සිටි බවත් එම අවස්ථාවේදී ඔහු විසින් මත්ද්‍රව්‍ය භාවිතා කරන බවටත් මත්ද්‍රව්‍ය භාවිතා කරන වාරු නමැති  පුද්ගලයෙක් සිටින බවට පැවසුවේ බොරුවක් බවට පැමිණිලිකරු විසින් කියා සිටි බවද සදහන් කර ඇත.

ඉන් පසුව පැමිණිලිකරුගේ මුළු නිවසම පරීක්ෂා කර නිවසේ තුළ තිබූ  සව් කොලයක් සහ තවත් දේවල් මේසයක් උඩ තබා ඔවුන් සියලු දෙනා අසල තබා ඡායාරූපයක් ලබා ගැනීමෙන් පසුව ඔවුන් සිව් දෙනා ජීප් රථයට නැගුනු බවත් එම අවස්ථාවේදී පැමිණිලිකරුගේ භාර්යාවට නොයෙක් අපහාස හා නොහොබිනා වචන පාවිච්චි කළ බවත් වැඩිදුරටත් සදහන් කර ඇත.

තවද එසේ අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී කාන්තා නිලධාරිණියක් නොසිටි බවත් පොලිස් ස්ථානයට රැගෙන යාමෙන් අනතුරුව පැමිණිලිකරුගේ ෂර්ට් එක ගලවා ඔහුට පහර දුන් බවත් පොලිස් සිර මැදිරියේ සිටි අනෙකුත් සැකකරුවන් පෙන්වා ඔහුව කූඩුවට දැමූ බවත් අනෙකුත් පුද්ගලයන් දෙදෙනාව ද කූඩුවට දමා පැමිණිලිකරුගේ භාර්යාව ඒ අසල වාඩි කරවා තිබූ බවත් පසුව ඇය ලවා මුළු පොලිස් ස්ථානයම අතුගාව ගත් බවත් රන්දිල් හා මධුශංක නිලධාරීන් දෙදෙනා සිටි කාමරයක් තුළට ඇයට පැමිණෙන ලෙසට දැන්වීමෙන් පසුව ඇය කෑ ගසන ශබ්දයක් ඇසුනු බවත් පැමිණිලිකරු විසින් කූඩුවේ සිට " ගෑණු පොලිස් නිලධාරියෙක්වත් නැති මේ පොලිස් ස්ථානයේ ගෑනු අයව කාමර වලට ගෙන්න ගෙන මොනවද කරන්නේ"යනුවෙන් කියා සිටි බවත් පොලිස් ස්ථානයේදී එම අවස්ථාවේ කිසිම කාන්තා නිලධාරිණිය් නොසිටි බවත් සදහන් කර ඇත.

පැමිණිලිකරුගේ භාර්යාව එම කාමරයෙන් එළියට පැමිණීමෙන් පසුව කුමක්ද වුනේ යනුවෙන් විමසූ විට භාර්යාව විසින් පවසන ලද්දේ නිලධාරීන් දෙදෙනා කැරපොත්තෙක් ඇගට විසි කරලා හිරිහැර කළ බවත් පසුව අතු ගාලා එකතු කල කුණු ටික ඇය ලවා අතින් එකතු කරලා දාන්න කියා සිටි බවත් ය. පැමිණිලිකරු පොලිස් සිරමැදිරිය තුළ සිටින අවස්ථාවේදී ඔහුගේ සහෝදරයෙකු විසින් ඡායාරූප ලබා ගන්නා ලද බවත් එකී ඡායාරූප වල පහර දුන් බවට පැහැදිලිව දැක ගැනීමට හැකි බවත් සදහන් කර ඇත.

තවද එම පොලිස් ස්ථානයට කාන්තා නිලධාරිණියක් පැමිණ සිටියේ එලිවුනාට පසුව බවත් එදින මත්ද්‍රව්‍ය චෝදනා වලට අධිකරණයට ඉදිරිපත් කර තිබූ බවත් ඊට පෙර කට උත්තර පොතේ රන්දීර නිලධාරියා විසින් යම්කිසි දෙයක් ලියා ඔවුන්ට අත්සන් කරන ලෙසට දන්වා සිටි බවත් අත්සන් නොකළහොත් බිරිදට කරදරයක් වන බවට තර්ජනය කළ බවත් එම හේතුවෙන් උසාවියේදී ද වරද පිලිගන්නා ලද බවත් රු. 10000/- ක දඩ මුදලක් ගෙවන්න සිදුවූ බවත් නීතිය ගැන නොදැනුවත්කම නිසා වරද පිලිගන්නා ලද බවත් සදහන් කර ඇත. උසාවියෙන් එළියට ආ ගමන්ම සුවසැරිය ඇම්බියුලන්ස් එක ගෙන්වා ගෙන කලුබෝවිල රෝහලට ඇතුළත් වූ බවත් එම රෝහලෙන් දින හතරක් ප්‍රතිකාර ලබා ගන්නා ලද බවත් වැඩිදුරටත් සදහන් කර ඇත.

ඒ අනුව මෙම පැමිණිලිකරුව නීතිවිරෝධී ලෙස අත්අඩංගුවට ගනිමින් මරණ තර්ජන කරමින් වදහිංසා කර ව්‍යාජ නඩු දමා ඔහුගේ මූලික අයිතිවාසිකම් කඩ කිරීම හා ඔහුගේ බිරිද වන රෂා හසීනා යන අයව නීතිවිරෝධී ලෙස අත්අඩංගුවට ගෙන ලිංගික හිරිහැර වන ආකාරයට හැසිරීම හා අවමන් සහගත ලෙස කටයුතු කරමින් ඇයගේ මූලික අයිතිවාසිකම් කඩකිරීම සම්බන්ධව පරීක්ෂණයක් පවත්වා සහනයක් ලබා දෙන ලෙසට ඉල්ලා ඇත.

මෙම පැමිණිල්ලේ දෙවන පැමිණිලිකාරිය වන රෂා හසීනා යන අය විසින් කොමිෂන් සභාවට දන්වා ඇත්තේ 2023 ඔක්තෝබර් 17 දින පළමු පැමිණිලිකරු නිවස අසළ ඇති රාත්‍රී වෙළදසැලක් වෙත පාන්දර 2.00 ත් 2.30 ත් අතර ගිය බවත් පැයකට පමණ පසු නිවස ඉදිරිපට මාර්ගය අසල වාහනයක් නවත්වන ශබ්දයක් ඇසුනු බවත්, ඉන් අනතුරුව නිල ඇදුමින් සැරසුනු පොලිස් නිලධාරියෙකු නිවසට පැමිණ ඇයගෙන් සගවන ලද බඩු ඉල්ලා සිටි බවත්, එවැනි දෙයක් පිළිබදව ඇය නොදන්නා බව පැවසීමෙන් පසුව ඇය අතේ තිබූ ජංගම දුරකථනය එම නිලධාරියා විසින් ලබා ගන්නා ලද බවත් පසුව නිවසේ සිටි පළමු පැමිණිලිකකරුගේ මිත්‍රයන් දෙදෙනාගෙන් ද ජංගම දුරකථන ලබා ගන්නා ලද බවත් අනතුරුව පළමු පැමිණිලිකරු පොලිස් නිලධාරීන් විසින් ඇදගෙන ආ බවත් එම අවස්ථාවේදී පළමු පැමිණිලිකරුට නිලධාරීන් විසින් කණට පහරවල් කිහිපයක් ගැසූ බවත් ඒ වනවිටත් පළමු පැමිණිලිකරුගේ මුහුණ ඉදිමී තිබුණ බවත් කකුල් වල තණකොළ කැලිද අත් දෙකද තුවාල වී තිබුණු බවට දෙවන පැමිණිලිකාරිය දුටු බවත් සදහන් කර ඇත.

තවද, පොලිස් අත්අඩංගුවේදී මෙම දෙවන පැමිණිලිකාරිය ද පොලිස් නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ජීප් රථයෙන් පොලිස් ස්ථානය වෙත රැගෙන යන අවස්ථාවේ අසභ්‍ය වචන වලින් බැණ වැදුනු බවත්, පොලිස් ස්ථානයේදී ද ඒ ආකාරයටම අසභ්‍ය වචනයෙන් බැණ වැදුනු අතර පොලීසිය දෙවන පැමිණිලිකාරිය ලවා අතු ගා ගත් බවත් එසේ අතු ගාමින් සිටියදී එහි සිටි කැරපොත්තෙකු මධුරංග නිලධාරියා විසින් මෙම පැමිණිලිකාරිය දෙසට දැමූ බවත් බියට පත්වී ඇය හයියෙන් කෑ ගැසූ බවත් අතුගා අවසානයේදී කුණු සියල්ල එකතු කර මෙම පැමිණිලිකාරියගේ අතින් ඉවත් කරන ලෙසට එම නිලධාරීන් විසින් පැවසූ බවත්, එම අවස්ථාවේදී කාන්තා නිලධාරිණියක් පොලිස් ස්ථානයේ නොසිටි බවත් වැඩිදුරටත් දන්වා ඇත.

03 වන පැමිණිලිකරු විසින් මෙම කොමිෂන් සභාවට දන්වා ඇත්තේ නීතිවිරෝධී ලෙස අත්අඩංගුවට ගෙන ව්‍යාජ නඩු ගොනු කරමින් පීඩාවට පත් කර මූලික අයිතිවාසිකම් කඩ කිරීම සම්බන්ධව කැස්බෑව පොලිස් නිලධාරීන්ට විරුද්ධව නීතිමය පියවර ගන්නා ලෙස ඉල්ලා ඇත. මෙහිදී මෙම පැමිණිලිකරු විසින් අත්අඩංගුවට ගැනීම සම්බන්ධව පොලිසිය විසින් ගොනු කරන ලද නඩුවේ වරද පිලිගෙන නඩුව අවසන් කරගෙන ඇති බවට වැඩිදුරටත් දන්වා ඇත.

මෙම පැමිණිල්ල සම්බන්ධව කොමිෂන් සභාව විසින් වගඋත්තරකාර පාර්ශවකරුගෙන් උදෘත වාර්තා ලබා ගෙන ඇති අතර පරීක්ෂණ කටයුතු සඳහා ඉහත සඳහන් සියළුම වගඋත්තරකරුවන් කැඳවීමට කටයුතු කර ඇත. මෙම පැමිණිල්ලට අදාළව 2024.02.21 දිනැති පරීක්ෂණ කටයුතු සඳහා ස්ථානාධිපති, පොලිස් ස්ථානය, කැස්බෑව වෙත සිතාසි යොමු කර ඇති අතර එදින පරීක්ෂණ සඳහා ස්ථානාධිපති වෙනුවෙන් උ.පො.ප. පොඩිරාලහාමි යන අය පෙනී සිටිමින් කොමිෂන් සභාව ඉදිරියේ දී ප්‍රකාශයක් ලබාදී ඇත. එම ප්‍රකාශය පළමු වගඋත්තරකරු වූ හිටපු ස්ථානාධිපති වෙනුවෙන් ලබා දෙන ලද ප්‍රකාශයක් බවට කොමිෂන් සභාව විසින් සලකන ලදී.

තවද දෙවන, තෙවන, සිව්වන සහ පස්වන වගඋත්තරකරුවන් මෙම පැමිණිලි විභාග කිරීම සඳහා මුල් අවස්ථාවේදී යොමු කරන ලද සිතාසියට කොමිෂන් සභාව ඉදිරියේදී පෙනී නොසිටීම මත ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 21 වන වගන්තිය යටතේ නොතීසි නිකුත් කර ඇති අතර එකී නොතීසිය සඳහාමෙම පාර්ශවකරුවන් සිව් දෙනා විසින් පෙනී නොසිටීම සම්බන්ධව දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇත.

ඉන් අනතුරුව මෙම පාර්ශවකරුවන් 2024.10.25 සහ 2024.12.11 යන දිනවල කැඳවා පරීක්ෂණ කටයුතු පවත්වා ඇති අතර එම දිනවල වගඋත්තරකරුවන් සිව්දෙනාම සහභාගී වී ඇති අතර නැවත වරක් දෙවන තෙවන සහ සිව්වන වගඋත්තරකරුවන් 2026.06.18 දින පරීක්ෂණ කටයුතු සඳහා කැඳවා ඇති නමුත් තෙවන වගඋත්තරකරු හේතුවක් නොදන්වා පැමිණ නොමැති අතර දෙවන සහ සිව්වන වගඋත්තරකරුවන් පෙනී සිට ඇත. එදින පළමු පැමිණිලිකරු විසින් මෙම කොමිෂන් සභාව වෙත පැමිණිල්ල සනාථ කිරීම සඳහා ඉදිරිපත් කර ඇති සීසීටීවී වීඩියෝ සාක්ෂි මගින් ඉදිරිපත් කර ඇති වීඩියෝ දර්ශන පෙන්වා වැඩිදුර පරීක්ෂණ කටයුතු සිදු කර ඇත.

<u>පළමුවන වගඋත්තරකරු වෙනුවෙන් උප පොලිස් පරීක්ෂක පොඩිරාලහාමි මහතා විසින් මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති කරුණු :</u>

මෙම පැමිණිල්ලට අදාළව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පරීක්ෂණ කටයුතු ආරම්භ කිරීමෙන් අනතුරුව 2024.02.21 දින මෙම කොමිෂන් සභාවේ පෙනී සිටින ලෙසට 01 වන වගඋත්තරකරු වන ස්ථානාධිපති, පොලිස් ස්ථානය වෙත සිතාසියක් නිකුත් කර ඇති අතර පරීක්ෂණ

කටයුතු සඳහා එදින ස්ථානාධිපති නියෝජනය කරමින් උප පොලිස් පරීක්ෂක පොඩිරාලහාමි යන අය පෙනී සිට ඇති අතර ඔහු විසින් පහත සඳහන් පරිදි කරුණු ඉදිරිපත් කර ඇත :

2023.10.16 දින කැස්බෑව පොලිස් ස්ථානයේ රාත්‍රී ජංගම සංචාර නියෝග අංක 288/23 පරිදි පො.සැ. 53175 අල්විස් පො.කො. 97522 රන්දීර, පො.කො.රි. 98994 මධුශංක නිලධාරියා විසින් පදවන ලද අංක 64-0946 දරණ ජීප් රථයෙන් රාත්‍රී ජංගම සංචාරයේ යෙදී සිටියදී එදින අලුයම 3.00 ට පමණ කැස්බෑව ඩිපෝව අසල ප්‍රදේශයේ සංචාරය කරන අතරතුරදී හොරණ සිට කැස්බෑව දෙසට පුද්ගලයෙකු දකුණුපසින් ගමන් කරමින් සිට ජීප් රථය දෙසට ධාවනය කර ඇති අතර අවේලාවේ මෙම පැමිණිලිකරු ගමන් කිරීම පිළිබඳව සැකයක් ඇතිවුනු හෙයින් ඔහු නවත්වා රන්දීර නිලධාරියා හා අල්විස් නිලධාරියා ජීප් රථයෙන් බැස ගොස් පැමිණිලිකරු පරීක්ෂා කිරීමට කටයුතු කරන අවස්ථාවේ උඹලා කොහොමද මාව චෙක් කරන්නේ ඇයි මොකද කියලා බහින් බස් වී පළා යාමට තැත් කර ඇති බැවින් අල්විස් නිලධාරියා ඇතුළු නිලධාරීන් දෙදෙනාම එම අවස්ථාවේදී මෙම පැමිණිලිකරු පාලනය කර ගැනීමට උත්සාහ කළත් ඔහු එකවරම එම ස්ථානයෙන් දුවගෙන යනවාත් සමග එම පිටුපසින් නිලධාරීන් පන්නගෙන යන අවස්ථාවේ එම පැන ගිය පුද්ගලයා කොන්ක්‍රීට් කනුවක ගැටී වැදුනු බවත් ඒ අවස්ථාවේදී නිලධාරීන්ට ලීයක් අරගෙන එම පුද්ගලයා පහරදීමට තැත් කළ බවත් මධුශංක නිලධාරියා මොහුව අල්ලා ගැනීමට ගිය අවස්ථාවේ පයින් පහරවල් 3 ක් ගැසූ බවත් මොහුව පාලනය කර ගැනීම සඳහා විනාඩි 10 ක් පමණ කාලයක් තුළ අවශ්‍ය බලය යොදා ගෙන ඔහු මෙල්ල කරගෙන අත්විලංගු දැමීමට කටයුතු කර ඇති බවත් සඳහන් කර ඇත.

ඒ පුද්ගලයා පරීක්ෂා කිරීමේදී ඔහුගේ කලිසම් සාක්කුවේ තිබී අයිස් පැකට්ටුවක් හමුවී ඇති අතර, සැකකරු වන වන්නිආරච්චිගේ අදීෂ නො. 55/40, ශ්‍රී මහා විහාර පාර, කළුබෝවිල, දෙහිවල යන අයට අයිස් මිලිග්‍රෑම් 20 ක් ලග තබා ගැනීමේ වරද කියාදී අත්අඩංගුවට ගෙන ස්ථානයට ගෙනවිත් නඩු බඩු කුවිතාන්සි අංක 1690/23 යටතේ ස්ථානයට ඉදිරිපත් කර කැස්බෑව ම/උ නඩු අංක 26670/23 යටතේ ඉදිරිපත් කිරීමෙන් පසු මෙම පැමිණිලිකරු විසින් වරද පිළිගෙන රු. 10000/- ක දඩ මුදලක් ගෙවා ඇත.

මෙම පැමිණිලිකරුගේ ප්‍රකාශය අනුව තවත් යාලුවන් දෙදෙනෙකු හා ඔහුගේ බිරිඳ අංක 14, හොරණ පාර, පොල්ගස්ඕවිට ලිපිනයේ සිටින බවට ලබාදී ඇති ප්‍රකාශය අනුව එම නිවසට ගොස් පරීක්ෂා කිරීමේදී එම නිවසේ පුද්ගලයින් දෙදෙනෙකු හා කාන්තාවක් සිට ඇති අතර එක් පුද්ගලයෙකු වන විශ්වලාගේ චලන කනිෂ්ක යන අයගේ සන්තකයේ තිබී අයිස් මත්ද්‍රව්‍ය පැකට්ටුවක් සොයා ගෙන ඇති බැවින් ඔහුවද අත්අඩංගුවට ගෙන ඇති අතර එම නිවසේ සිටි අනෙකුත් පුද්ගලයා වන කුරුවිටගේ ලහිරු චතුරංග යන අය පරීක්ෂා කිරීමේදී ඔහු සන්තකයේ තිබී අයිස් මිලිග්රෑම් 20 ක් අඩංගු පැකට්ටුවක් සොයා ගෙන ඇති අතර ඔහුවද අත්අඩංගුවට ගෙන ඇත.

තවද එම නිවසේ රැඳී සිටි කාන්තාව වන කේ.ඩී. රෂා හසිනා යන කාන්තාව ජංගම සංචාරයේ සිටි නිලධාරීන් විසින් ජීප් රථය යවා කා.පො.කො. 13067 දනුෂිකා යන අයව ගෙන්වා පරීක්ෂා කර ඇති

අතර පරීක්ෂා කිරීමේදී ඉහත සඳහන් පුද්ගලයින් තිදෙනා අයිස් පානය කිරීම සඳහා පැමිණ ඇති බවට එම කාන්තාව විසින් ප්‍රකාශ කර ඇති බවත් එම ස්ථානයේ තවදුරටත් රැඳී සිටීමෙන් යම් වරදක් හෝ අපරාධයක් සිදුවීමට ඇතැයි සැක සිතී ඇයගෙන් අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා එම කාන්තාවද අත්අඩංගුවට ගෙන ඉහත කී කා.පො.කො. දනුෂිකා භාරයේ තබා ගෙන පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇති බවට වැඩිදුරටත් කරුණු ඉදිරිපත් කර ඇත.

පැමිණිලිකරු වෙත පහරදීමක් කළ බවට මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලි කර ඇතත් ඔහුව අත්අඩංගුවට ගැනීමට අවම බලය යෙදීම සහ සැකකරු වැටීම ආදී සිද්ධීන් හේතුවෙන් සහ ඔහුට විරුද්ධව නඩු පැවරීම ද හේතු කොට ගෙන ඇති කර ගන්නා ලද සිත් අමනාපය මත මෙම පැමිණිල්ල ඉදිරිපත් කර ඇති බවත් ඇයගේ බිරිද ලවා පොලිස් නිලධාරීන් විසින් පොලිසිය තුළ පිරිසිදු කර ගත් බවට ඉදිරිපත් කරන ලද කරුණු අසත්‍යයක් බවත් මෙම කොමිෂන් සභාව වෙත කරුණු ඉදිරිපත් කර ඇත.

***<u>දෙවන වගඋත්තරකාර පොලිස් සැරයන් 53175 ඔලබොඩුවගේ යසසිරි ගාමිනී අල්විස් යන අයගේ කරුණු දැක්වීම :</u>***

පැමිණිල්ලේ සඳහන් සිද්ධිය සිදුවූ රාත්‍රියේ ඔහු ජංගම සංචාරයේ යෙදී සිටි බවත් එකී සංචාරයේ යෙදී සිටින අවස්ථාවේ ඩිපෝව අසල තිබෙන නයිට් කඩයකට තේ පානය කිරීම සඳහා ගිය බවත් එම ස්ථානයේදී දෙරණ නාලිකාවේ සේවය කරන හිතවත් මිතුරෙක් සිටි බවත්, පරීක්ෂණයේදී එම මිතුරාගේ නම විමසා සිටීමේදී දූෂාන් බවට සඳහන් කර ඇත.

එම මිතුරා සමග ඔවුන් සියලු දෙනා තේ පානය කර එළියට පැමිණෙන අවස්ථාවේ චුට් බයිසිකලයක් වගේ එකක පැමිණිලිකරු හොරණ පැත්තේ සිට එම කඩයට පැමිණි බවත් ඒ වෙලාවෙ හැටියට එම පැමිණිලිකරු සම්බන්ධයෙන් ඔවුන්ට සැකයක් මතුවූ බවත් ඒ අනුව ඔහුව පරීක්ෂා කිරීමට උත්සාහ කිරීමේදී ඔහු විසින් ප්‍රතිරෝදය දැක්වූ බවත් සඳහන් කර ඇත.

පැමිණිලිකරු පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් මෙම වගඋත්තරකරුගෙන් ප්‍රශ්න කිරීමේදී ඔහු විසින් උත්තර ලබාදී ඇත්තේ අල්විස් යන ඔහු විසින් 97522 රන්දීර නිලධාරියා වෙත මෙම පැමිණිලිකරු පරීක්ෂා කරන ලෙසට දන්වා සිටි බවත් පරීක්ෂා කිරීමේදී මෙම පැමිණිලිකරු ඒ සඳහා ඉඩ ලබා නොදුන් බවත් ඉන් පසුව ඔහු විසින් අනෙකුත් නිලධාරියා වෙත මේ පිළිබඳව බලන ලෙසත් එම අවස්ථාවේදී මෙම පැමිණිලිකරු දගලන්න පටන් ගත් බවත් ඔහුද ඉන් පසුව එම ස්ථානයට ගොස් මෙම පැමිණිලිකරු පාලනය කරගෙන ජීප් රථයට නංවා ගත් බවත් සඳහන් කර ඇත.

ඉන් පසුව ජීප් රථය තුළදී ඔහු පැමිණිලිකරුව පරීක්ෂා කළ බවත් පැමිණිලිකරු සන්තකයේ තිබී අයිස් පැකට් එකක් ලැබුණු බවත් ඒ සම්බන්ධයෙන් විමසීමේදී පැමිණිලිකරුගේ බිරිද සහ තව මිතුරෙකු

නිවසේ සිටින බවට ඔවුන් වෙත ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත. නිවසේ කාන්තාවක් සිටින බැවින් පොලිස් ස්ථානයට ගොස් කාන්තා පොලිස් කොස්තාපල් 13067 දනුෂිකා යන අයව රැගෙන පැමිණිලිකරුගේ නිවසට ගිය බවත් එම අවස්ථාවේදී දෙරණ නාලිකාවේ සේවය කරන ඉහත කී මිතුරා ද ඔවුන් සමග සිටි බවත් එම මිතුරා සමග පැමිණිලිකරුගේ නිවසට ඇතුළු වුනු බවත් නිවසේ කාන්තාවක් සහ පිරිමි දෙදෙනෙකු සිටි බවත් නිවසේ ඇතුළට යන විට පොඩි ස්ටූල් එක උඩ ලයිටර් වීදුරු කටු පාවිච්චි කළ අයිස් හිස් පැකට් තැන් තැන් වල තිබුණු බවත් සඳහන් කර ඇත.

නිවසේ සිටි පිරිමි පුද්ගලයින් දෙදෙනාව ඔහු විසින්ම පරීක්ෂා කිරීමේදී ඔවුන් දෙදෙනා සන්තකයේ තිබී අයිස් මත්ද්‍රව්‍ය සොයා ගැනීමට හැකිවූ බවත් ඔවුන්ට වරද කියාදී අත්අඩංගුවට ගන්නා ලද බවත් ඔවුන් සමග ගිය කාන්තා නිලධාරිණිය ලවා නිවසේ සිටි කාන්තාව පරීක්ෂා කළ බවත් ඇයගේ සන්තකයේ කිසිවක් නොතිබු නමුත් එම ස්ථානයේ අනාරක්ෂිත බව සිතා සහ එම ස්ථානයේ තවත් කිසියම් මත්ද්‍රව්‍ය තිබී සැඟවීමට උත්සාහ දරයි යන සැකය මත එකී කාන්තාව පොලිස් ස්ථානයට රැගෙන ගිය බවත් සටහන් යොදා උපසේවකට බාර දුන් බවත් මෙම සැකකරුවන් සියලු දෙනා පොලිස් ස්ථානයට රැගෙන යන විට වෙලාව පාන්දර 3.00 – 4.00 ට පමණ ඇති බවත් සඳහන් කර ඇත.

පැමිණිලිකරු විසින් ඔහුගේ පැමිණිල්ලේ සඳහන් කර ඇති පරිදි පහරදීම සම්බන්ධයෙන් මෙම වගඋත්තරකරුගෙන් විමසීමේදී ඔහු විසින් සඳහන් කර ඇත්තේ පහරදීමක් සිදු නොවූ බවත් පැමිණිලිකරුගේ බිරිද ලවා පොලීසිය අතුගා ගත් බවට කර ඇති චෝදනාව පිලි නොගන්නා බවත් පැමිණිලිකරුගේ බිරිදව එදින උදේ 6.00 ට පමණ සේවයට වාර්තා කරන ලද උපසේවක 11824 මධුෂානි යන අයට භාර දුන් බවත් පැමිණිලිකරු, ඔහුගේ බිරිද සහ අනෙකුත් සැකකරුවන් දෙදෙනා පොලිස් ස්ථානය වෙත රැගෙන එන අවස්ථාවේදී ඔවුන් සමග සිටි දෙරණ නාලිකාවේ සේවය කරන මිතුරා පාර අයිනෙන් බස්වා ගිය බවත් සඳහන් කර ඇත.

මෙම වගඋත්තරකරුගෙන් වැඩිදුර විමසීමේදී එදින ජංගම සංචාරයේ ගමන් කළ වාහනයේ අංකය විමසීමේදී අංක 64-946 දරණ ජීප් රථය බවට සඳහන් කර ඇත. පළමු පැමිණිලිකරු විසින් 2024.03.19 දින ඉදිරිපත් කර ඇති වීඩියෝ සාක්ෂියේ Out door වීඩියෝවේ සඳහන් කැමරා දර්ශන පෙන්වා සිටි අතර එහිදී කඩය අසලට පැමිණෙන ජීප් රථය මෙම වගඋත්තරකරුවන් ගමන් කළ ජීප් රථයද යන්න විමසීමේදී එය මෙම වගඋත්තරකරු විසින් පිලිගන්නා ලද අතර එකී ජීප් රථයේ සිට මුලින්ම බහින්නේ මෙම දෙවන වගඋත්තරකරු බවටත් පිටුපස දොරෙන් බහින නිලධාරියා කවුද යන්න විමසීමේදී තෙවන වගඋත්තරකරු රන්දීර යන අය බවටත් මෙම නිලධාරියා සමග ජීප් රථය ඇතුලේ සිට කළු පාට ටී-ෂර්ට් ඇද එළියට බහින පුද්ගලයා කවුද යන්න විමසීමේදී දූෂාන් නමැති මිතුරා බවටත් කඩය දෙසට එන නිලධාරියා සිව්වන වගඋත්තරකරු වූ මධුශංක යන අය බවට සඳහන් කර ඇත.

තවද In door කැමරා දර්ශන පෙන්වා සිටීමේදී එම ස්ථානයට පැමිණෙන මෙම පැමිණිල්ලේ පළමු පැමිණිලිකරුව මෙම දෙවන වගඋත්තරකරු හඳුනා ගතහැකි බවත් පැමිණිලිකරුව මෙම සිදුවීමට පෙර කිසිදු අවස්ථාවකදී දැක නොමැති බවත් එම කඩය අසල සිටින අනෙකුත් පුද්ගලයින් හඳුනන්නේ නැති බවටත් පැමිණිලිකරුගේ අතේ තිබුණු ජංගම දුරකථනය වගඋත්තරකරුවන්ගේ භාරයට ගැනීමට හේතුව විමසීමේදී මෙම දෙවන වගඋත්තරකරු විසින් දන්වා ඇත්තේ ඒ වෙලාවේ හැටියට ඔහු කාටද කතා කළේ සහ සැකසහිත නිසා ඒ සම්බන්ධව විස්තර සොයා බැලීමට ජංගම දුරකථනය සිව්වන වගඋත්තරකරුට ගන්න කියලා උපදෙස් ලබා දුන් බවට සඳහන් කර ඇත.

එම In door සහ Out door කැමරා දර්ශන වල සිටින්නේ මෙම දෙවන වගඋත්තරකරු සහ ඔහු සමග ගමන් කළ අනෙකුත් නිලධාරීන් දෙදෙනා බවට පිලිගන්නා ලද අතර වෙලාව 2:44:21 ට ජීප් රථය පසු කරමින් ස්කේටින් ස්කූටරයක් සමග කඩය දෙසට පැමිණෙන පුද්ගලයා මෙම පැමිණිලිකරු බවට පිලිගෙන ඇත.

වගඋත්තරකරුවන් සමග ගමන් කළ බාහිර පුද්ගලයා විසින් තෙවන වගඋත්තරකරුගේ අතට මාංචුව ගෙනත් දෙන බවට වීඩියෝ සාක්ෂි වල සටහන් වී තිබුණු දර්ශන පිලිගන්නා ලද අතර බාහිර පුද්ගලයෙකු විසින් එවැනි දෙයක් සිදු කිරීමට අවස්ථාවක් ලබා දීම සම්බන්ධව විමසීමේදී සඳහන් කර ඇත්තේ පැමිණිලිකරු අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී වගඋත්තරකරුවන් සිටියේ තිදෙනෙකු පමණ බැවින් අවශ්‍ය වන අවස්ථා වලදී මහජනතාවගෙන් උදව් ලබා ගන්නා බවත් ඒ අනුව ඔවුන්ට උදව්වක් වශයෙන් එවැනි දෙයක් බාහිර පුද්ගලයන් විසින් සිදු කළ බවත් වැඩිදුරටත් දන්වා ඇත.

එකී වීඩියෝ දර්ශන වල පටිගත වී තිබෙන පැමිණිලිකරුට මෙම වගඋත්තරකරුවන් තිදෙනා විසින් සිදු කරනු ලබන පහරදීම් දර්ශන පෙන්වා සිටි අතර ඒ පිළිබඳව විමසා ඇත. ඒ සඳහා පිළිතුරු ලබාදී ඇත්තේ පැමිණිලිකරු ප්‍රතිරෝදය පාමින් කියන දේ අහන්නේ නැතිව දැඟලූ බවත් මෙම පැමිණිලිකරුව ඔවුන් හඳුනන්නේ නැති බවත් යම්කිසි වැරැද්දක් කරලා ආව කෙනෙක්ද කියලා හරියටම නොදන්නා බැවින් වගඋත්තරකරුවන්ට එම අවස්ථාවේදී අවම බලය භාවිතා කිරීමට සිදුවූ බවත් ය.

මෙම වගඋත්තරකරු විසින් සඳහන් කළ පරිදි ඒ වෙලාවේ හැටියට මෙම පැමිණිලිකරු සම්බන්ධයෙන් සැක සිතුනා නම් එම කඩය අසල සිටි අනෙකුත් පුද්ගලයින් සම්බන්ධව සැක සිතුනේ නැද්ද යන්න විමසීමේදී ප්‍රතිචාර දක්වා ඇත්තේ අනෙක් අය කඩය අසල සිටි අය බවත් මෙම පැමිණිලිකරු කලබලයෙන් වගේ විරුද්ධ පැත්තෙන් ආව පුදගලයෙක් බවත් සඳහන් කර ඇති අතර පැමිණිලිකරුගේ නිවසට ගිය අවස්ථාවේදී වගඋත්තරකරුවන් සමග ඉහත සඳහන් දූෂාන් නමැති මිතුරා ද සිටි බවට පිලිගන්නා ලද බව අඳුරු පිට්ටනියකදී පහර දීමක් සිදුවූ බවට පැමිණිල්ලේ ඇති චෝදනාව පිලිනොගන්නා බවට වැඩිදුරටත් සඳහන් කරයි.

<u>**තෙවන වගඋත්තරකාර විතාරනගේ ප්‍රභාත් රන්දීර යන අය විසින් ඉදිරිපත් කර ඇති කරුණු :**</u>

2023.10.17 දින රාත්‍රී ජංගම සංචාරයේ යෙදී සිටි බවත් එම අවස්ථාවේ අල්විස් සාජන් මහත්තයා සහ රියදුරු මධුශංක ද සිටි බවත් 119 දුරකථන ඇමතුමක් ලැබීමෙන් පසුව පොල්ගස්ඕවිටට ගොස් නැවත පැමිණෙන විට මධුශංක නිලධාරියා නිදිමත බවට පැවසූ බැවින් ඩිපෝව ඉදිරිපිට ඇති නයිට් කඩයකට තේ පානය කිරීමට ගිය බවත් එම අවස්ථාවේදී ඔවුන් හඳුනන දෙරණ නාලිකාවේ සේවය කරන පුද්ගලයෙකු සිටි බවත් ඔහු සමග කතා බහ කිරීමෙන් පසුව ඔවුන් පොලිසිය පැත්තට යන නිසා එම පුද්ගලයාව ද ඇරලවන්නම් කියලා පැවසූ බවත් ඔවුන් තිදෙනා නිල ඇඳුමින් සිටි බවත් එම පුද්ගලයා කලු පාට ටී ෂර්ට් එකක් ඇදගෙන සිටි බවත් සඳහන් කර ඇත.

තවද ඔවුන් යාමට සූදානම් වෙමින් සිටියදී හොරණ පැත්තේ සිට කැස්බෑව පැත්තට පාරේ වම් පැත්තේ මෙම පැමිණිලිකරු පැමිණෙන බවට දුටු බවත් සාජන් මහතා විසින් පවසා සිටියේ ඔහුව සැක බවත් ඒ හේතුවෙන් ඔහුව පරීක්ෂා කරන ලෙසත් මෙම නිලධාරියා වෙත දැන්වූ බවත් ඒ අනුව ඔහු වාහනයෙන් බැස පැමිණිලිකරුගෙන් කොහෙද යන්නේ යනුවෙන් විමසා සිටි බවත් ඔහු විසින් බීඩි ගන්න කඩයට ආව බවට උත්තර දුන් බවත් එම අවස්ථාවේදී ඔහුට වඩා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් සිටිය නිසා මෙම පැමිණිලිකරුව සාජන් මහත්තයාට යොමු කළ බවත් වැඩිදුරටත් සඳහන් කර ඇතග

සාජන් මහතා මෙම පැමිණිලිකරුගෙන් ප්‍රශ්න කළ බවත් එම අවස්ථාවේදී ඔහු එතනින් මදක් ඉවත්ව සිටි බවත් මෙම පැමිණිලිකරු සහ සාජන් මහතා අතර වචන හුවමාරුවක් සිදුවූ බවත් ඉන් අනතුරුව මෙම පැමිණිලිකරු යම්කිසි දෙයක් පාවිච්චි කරන බවට සැකයක් තිබෙන බැවින් වාහනයට දාගන්නා ලෙස සාජන් මහතා විසින් දැන්වූ බවත් සඳහන් කර ඇත. කෙසේ වෙතත් මෙම පැමිණිලිකරු කඩය තුළට ගිය බැවින් ඔහු මධුශංක නිලධාරියාට කථා කර සාජන් මහතා පැවසූ බැවින් පැමිණිලිකරු අල්ලලා ජීප් රියට දා ගත් බවත් එම අවස්ථාවේදී සාජන් මහතා වාහනයේ ඉදිරිපිට අසුනේ සිටි බවත් ඉන් පසුව පැමිණිලිකරුගෙන් විමසීමේදී 14 කණුවේ ලිපිනයේ බිරිද සමග සතියක සිට කුලියට සිටින බවට පැවසූ බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

මෙම වගඋත්තරකරුගෙන් වැඩිදුර ප්‍රශ්න කිරීමේදී සඳහන් කර ඇත්තේ පැමිණිලිකරුගෙන් ජාතික හැඳුනුම්පත ඉල්ලා සිටි බවත් එසේ ඉල්ලා සිටියේ ජීප් එකට දාගත්තට පසුව බවත් ඔහු පලා යාමට උත්සාහ කිරීමේදී මධුශංක නිලධාරියාට කතා කර ජීප් රියට නංවා ගත් බවත් පැමිණිලිකරුගෙන් ඔවුන් විසින් ප්‍රශ්න කිරීමේදී පැමිණිලිකරු මියුසික් කරන බවත් නිවසේ බිරිද සමග නිවසේ අයිතිකාරයා ද සිටින බවට පැවසූ බවට ප්‍රකාශ කර ඇත.

ඔවුන් විසින් ඉහත කී දෙරණ නාලිකාවේ සේවය කරන පුද්ගලයා පයින් යන බවට පැවසූ නමුත් ඔවුන් පොලීසියට යන නිසා එම පුද්ගලයාව ද වාහනයට නංවා ගෙන කැස්බෑව හන්දියෙන් බස්වා ගිය බවත් පැමිණිලිකරුගේ නිවසේ බිරිද සිටින බවට පැවසූ හෙයින් කැස්බෑව පොලීසියට ගොස් කාන්තා

නිලධාරිණී ඩබ්පීසී 13067 දනුෂිකා යන අයව එක් කරගෙන පැමිණිලිකරුගේ 14 කනුවේ නිවසට පාන්දර 2.00 ත් 2.30 ත් අතර (මතක හැටියට) ගිය බවත් සඳහන් කර ඇත.

තවද මෙම වගඋත්තරකරුගෙන් වැඩිදුර විමසීමේදී ප්‍රකාශ කර ඇත්තේ දනුෂිකා යන නිලධාරිණිය එදින රාත්‍රී සේවයේ සිටි නිලධාරිණියක් නොවන බවත් කාන්තා නිලධාරිණියක් එම අවස්ථාවේ නොමැතිවීම හේතුවෙන් ඇයගෙන් සහයෝගයක් ලබා ගන්නා ලද බවත් ය. තවද පැමිණිලිකරුගේ නිවසට ලගා වීමෙන් අනතුරුව පැමිණිලිකරු අල්විස් සාජන් මහතා සමග ජීප් එකේ තියලා රන්දීර යන මෙම නිලධාරියා සමග කා.පො.කො. දනුෂිකා සහ මධුශංක යන අය නිවසට ඇතුලු වූ බව එම අවස්ථාවේදී කාන්තා නිලධාරිණිය බොටම් සහ ටී ෂර්ට් (ක්‍රීඩා ඇදුම) එකකින් සැරසී සිටි බවත් ප්‍රකාශ කර ඇත.

නිවසට ඇතුලු වීමෙන් පසුව පැමිණිලිකරුගේ බිරිද, නිවසේ අයිතිකරු සහ තවත් එක් පුද්ගලයෙකු සිටි බවත් එම අවස්ථාවේදී පිරිමි දෙදෙනෙකු සමග බිරිදව තනිවම තබා පාන්දර ඇයි එලියට ගියේ යනුවෙන් පැමිණිලිකරුගෙන් විමසා සිටි බවත් ඉන් පසුව නිවස පරික්ෂා කළ බවත් වීදුරු කටු, ලයිටර් කැඩිච්ච ඒවා සහ හොද ඒවා සහ අයිස් පැක් කරලා පැකට් සහ ගංජා වලට පාවිච්චි කරන ටිෂූ තිබූ බවත් සාලයේ තිබුනු මේසයක තිබී හමුවූ බවත් සඳහන් කර ඇත.

ඉන් අනතුරුව සාජන් මහත්තයා නිවසේ සිටි පිරිමි පුද්ගලයින් දෙදෙනා පරික්ෂා කරන ලෙස පැවසීමෙන් අනතුරුව මෙම නිලධාරියා විසින් පැමිණිලිකරුගේ යාඑවාව පරික්ෂා කළ බවත් ඔහු එම අවස්ථාවේදී සරමක් ඇදගෙන සිටි බවත් ඔහුගේ ඉන හරියේ අයිස් පැකට් එකක් තිබී සොයා ගත් බවත් පැමිණිලිකරු ළග අයිස් පැකට් තිබුණු බවට සාජන් මහතා විසින් පැවසූ නමුත් ඔහු එය දුටුවේ නැති බවත් මධුශංක නිලධාරියා විසින් පරික්ෂා කරන ලද අනෙකුත් පුද්ගලයාගේ අතේ අයිස් තිබුණු බවට පැවසූ නමුත් ඔහු දුටුවේ නැති බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

තවද, පැමිණිලිකරුගේ බිරිද සමග අනෙකුත් තිදෙනා පොලිස් ස්ථානය වෙත රැගෙන ගිය බවත් ඩබ්පීසී විසින් පැමිණිලිකරුගේ බිරිද පරික්ෂා කළ බවත් ඇය සන්තකයේ කිසිවක් නොතිබූ බවත් එම අවස්ථාවේදී වෙලාව 3.20 – 3.30 ට පමණ තිබුණු බවත් ඉන් අනතුරුව තිදෙනාගේ කට උත්තර ලබා ගන්නා ලද බවත් පසුව පැමිණිලිකරුව කුඩුවට දමා එදින ඔහුව මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද බවත් ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරුගෙන් වැඩිදුර විමසීමේදී ඔහු විසින් ප්‍රකාශ කර ඇත්තේ මෙම පැමිනිලිකරුව ඔහු කිසිදු අවස්ථාවක පරීක්ෂාවට ලක් නොකරන ලද බවත් අනෙකුත් නිලධාරීන් දෙදෙනා විසින් මෙම පැමිණිලිකරු පරික්ෂා කරන බවට කිසිම අවස්ථාවකදී නොදුටු බවත් ය. තවද කඩය ඉදිරිපිටදී මෙම පැමිණිලිකරුව අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී අල්විස් නිලධාරියා වාහනයෙන් බැස පැමිණියේදැයි විමසීමේදී මෙම නිලධාරියා විසින් උත්තර ලබාදී ඇත්තේ ජීප් එකට දා ගන්න හදන කොට පිටුපස දොර ලගට පැමිණ සිටි බවයි.

පැමිණිල්ලේ සඳහන් පහරදීම සම්බන්ධව මෙම නිලධාරියාගෙන් විමසීමේදී ඔහු විසින් ප්‍රකාශ කර ඇත්තේ කිසිම අවස්ථාවක පහරදීමක් සිදු නොවූ බවත් ජීප් එකට දාගන්න විට පොර බැදීමක් සිදුවුන බවත්ය. පැමිණිලිකරුගේ බිරිද වන රෂා හසීනා යන අයව පොලිස් ස්ථානයට රැගෙන යාමෙන් අනතුරුව කාන්තා පොලිස් නිලධාරිණියක් වන දනුෂිකා යන අය පොලිස් ස්ථානයේ රැදී සිටියාද යනුවෙන් විමසීමේදී එදින උදේ උප සේවක පැමිණෙන තුරු එම නිලධාරිණිය රාජකාරියේ සිටි බවට ප්‍රකාශ කර ඇත.

තවද පැමිණිලිකරුගේ බිරිද ලවා පොලීසියේ අතු ගා ගත් බවට පැමිණිල්ලේ සඳහන් කර ඇති චෝදනා සම්බන්ධව විමසීමේදී ප්‍රකාශ කර සිටියේ මෙම නිලධාරියා සිටියේ ඇඩ්මින් අංශයේ බැවින් ඇය දුටුවේ නැති බවයි. තවද පැමිණිලිකරුගේ බිරිදට එක එක දේවල් පැවසූ බවට පැමිණිල්ලේ සඳහන් කර ඇති චෝදනාව පිලි නොගන්නා බවත් වැඩිදුරටත් මෙම නිලධාරියා විසින් ප්‍රකාශ කර ඇත.

<u>**සිව්වන වගඋත්තරකාර විජේසූරිය ආරච්චිගේ සචිරු මධුශංක යන අයගේ කරුණු දැක්වීම :**</u>

මෙම පැමිණිල්ලට අදාළ සිදුවීමට අදාළ රාත්‍රී රාජකාරියේ ඔහු සමග පො.සැ. 53175 අල්විස්, පො.කො. 97522 රන්දීර යන නිලධාරීන් දෙදෙනා ද සිටි බවත් පැමිණිලිකරුව පළමුවෙන්ම හමු වන්නේ හොරණ පාරේ ඇති නයිට් කඩය අසල දී බවත් ඔවුන් එම ස්ථානයට තේ පානය කිරීම සඳහා ගිය බවත් ඒ දිනවල ගෙවල් කැඩූ සිද්ධි කිහිපයක් තිබුණු බැවින් මෙම පැමිණිලිකරුගෙන් ද ප්‍රශ්න කළ බවත් ඔහු විසින් පැමිණිලිකරුගෙන් මුලින්ම අසා සිටියේ ගෙවල් කොහෙද යනුවෙන් බවත් එම අවස්ථාවේදී මෙම පැමිණිලිකරු කෑ ගසමින් තමන් මියුසික් කාරයෙක් බවත් එම ප්‍රදේශයේ නවාතැන් ගෙන සිටින බවට ප්‍රකාශ කර සිටි බවත් ය.

එම අවස්ථාවේදී ඔවුන් තිදෙනා වාහනයේ සිටි බවත් ඉන් පසුව අල්විස් නිලධාරියා රන්දීර නිලධාරියාට වාහනයෙන් බැස ඔහුව පරීක්ෂා කරන ලෙසට දන්වා සිටි බවත් ප්‍රකාශ කර ඇත. එසේ මෙම පැමිණිලිකරුව පරීක්ෂා කිරීමේදී පොර බැදීමක් සිදුවුන බවත් එම අවස්ථාවේදී අල්විස් නිලධාරියා විසින් වාහනයෙන් බැස ගොස් බලන ලෙසට මෙම නිලධාරියා වෙත දන්වා සිටි බවත් අල්විස් මහතා ද ඔහු සමග එම ස්ථානයට ගිය බවත් කඩය අසලදී පොර බැදීමක් සිදුවූ බවත් ඉන් අනතුරුව ඔහුව ජීප් රියට නංවා ගත් බවත් සඳහන් කර ඇත.

මෙම වගඋත්තරකරුගෙන් 2024.12.11 දින පරීක්ෂණයේදී මෙම පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමට හේතුව කුමක්ද යනුවෙන් මෙම නිලධාරියාගෙන් විමසා ඇති අතර ඒ සඳහා ඔහු විසින් ප්‍රකාශ කර ඇත්තේ පැමිණිලිකරු සන්තකයේ තිබී බීඩිත් එක්ක අයිස් කැල්ලක් රන්දීර නිලධාරියාට හමුවූ බවත් එම හේතුව මත අත්අඩංගුවට ගන්නා ලද බවත් ය. එදින පරීක්ෂණයේදී වැඩිදුර විමසීමේදී මෙම නිලධාරියා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ මෙම නයිට් කඩය අසලදී දෙරණ නාලිකාවේ සේවය කරන පුද්ගලයෙකු ඔවුන්ට හමුවූ බවත් ඔහුවද වාහනයේ නංවා ගෙන යන ලෙසට ඔහු විසින්

ඉල්ලීමක් කළ බවත් ඔහුව ඇරලවන්න පොලීසිය පැත්තට ගොස් නිවස යන මාර්ගය අසල බස්වා පොලීසියට ගොස් දනුෂිකා නිලධාරිණිය සමග පැමිණිලිකරුගේ නිවසට ගිය බවත් ය.

එසේ යන අවස්ථාවේදී නිවසේදි පිරිමි දෙදෙනෙකු සහ ගැහැණු ළමයෙක් සිටි බවත් නිවස පරීක්ෂා කිරීමේදී නිවස තුළ තිබුණු මේසයක් උඩ අයිස් ගහන්න ගත් බට වීදුරු කටු කුඩු කරපුවා තව ටියුබ් ලයිට් කුඩු කරපුවා, අයිස් ගහල ඉතිරි වූ හිස් පැකට් තිබුණු බවත් ඉන් අනතුරුව පැමිණිලිකරු සහ අනෙකුත් සියලු දෙනා රැගෙන පොලිසියට ගිය බවත් ය.

නිවසේදී සාජන් මහතා සහ රන්දීර නිලධාරියා විසින් නිවසේ සිටි පිරිමි පුද්ගලයින් දෙදෙනාව පරික්ෂා කිරීමෙන් අනතුරුව ඔවුන් සතුව තිබී අයිස් පැකට් සොයා ගන්නා ලද බවත් නිවසේ සිටි කාන්තාව ළග මත්ද්‍රව්‍ය කිසිවක් නොතිබූ බවත් බිරිදව නිවසේ තනිව තබා යාමට නොහැකි බවට පැමිණිලිකරු පැවසූ බැවින් පැමිණිලිකරුගේ බිරිඳ ඇතුළු හතර දෙනාම පොලිස් ස්ථානයට රැගෙන ගිය බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

මෙම නිලධාරියාගෙන් වැඩිදුර ප්‍රශ්න කිරීමේදී ප්‍රකාශ කර ඇත්තේ පොලිස් නිලධාරීන් තිදෙනාම පොලිස් නිල ඇඳුමින් සැරසී සිටි බවත් කාන්තා නිලධාරිණිය ක්‍රීඩා ඇඳුමින් සිටි බවත් එම කාන්තා නිලධාරිණිය එදින රාත්‍රියේ සේවයේ නොසිටි අතර ඇය සිටියේ කාන්තා හට නිවාසයේ දී බවත් එදින රාත්‍රී ජංගම සංචාරයේ දී අවශ්‍ය වූ බැවින් මෙම නිලධාරිණිය එක් කරගෙන ගිය බවත් පොලිස් ස්ථානයට ඔවුන් සියලු දෙනා රැගෙන ගොස් කූඩුවට දමා ගැහැණු ළමයාව පමණක් කූඩුව අසල වාඩි කරවූ බවත් එම අවස්ථාවේ වෙලාව පාන්දර 4.00 – 4.30 ට පමණ බවත් ස්ථානාධිපතිතුමා එම අවස්ථාවේ නොසිටි බවත් ය.

තවද වගඋත්තරකරු විසින් ඉදිරිපත් කර ඇති උදෘත අනුව ටී 56 රිවෝල්වරයක් එදින රාත්‍රී ජංගම සංචාරයේදී නිලධාරීන් සතුව තිබූ බවට සටහන් යොදා තිබුන බැවින් එකී රිවොල්වරය තිබුණේ කුමන නිලධාරියා සන්තකයේ ද යනුවෙන් විමසීමේදී මෙම නිලධාරියා විසින් ප්‍රකාශ කර ඇත්තේ එකී රිවෝල්වරය අල්විස් නිලධාරියා භාරයේ තිබුණු බවත් පසුව රන්දීර නිලධාරියාගේ අතේ තිබුණ බවත් පැමිණිලිකරුගේ නිවසේ දී රන්දීර නිලධාරියාට එතන සිටි පිරිමි පුද්ගලයෙක්ව පරීක්ෂා කිරීමට අවශ්‍ය වූ බැවින් එකී රිවෝල්වරය මෙම නිලධාරියාගේ අතට ගන්නා ලද බවත් දන්වා ඇත.

පැමිණිලිකරු විසින් පහරදීමක් සම්බන්ධයෙන් සිදු කර ඇති චෝදනා සම්බන්ධව විමසා සිටීමේදී පහරදීමක් සිදු නොවූ බවත් කඩය අසල අත්අඩංගුවට ගන්නා විට පොර බැදීමක් සිදුවූ බවත් ඔවුන් ද පැමිණිලිකරු පහර දුන් බවත් පැමිණිලිකරු පලා යාමට උත්සාහ නොකළ නමුත් අත්අඩංගුවට ගැනීමට අකමැත්ත පල කළ බවත් ප්‍රකාශ කර ඇත.

මෙම වගඋත්තරකරුගෙන් වැඩිදුර විමසීමේදී දන්වා ඇත්තේ ඔවුන් සමග ගමන් කළ දෙරණ නාලිකාවේ වැඩ කළ පුද්ගලයා තෙවන වගඋත්තරකරු හඳුනන පුද්ගලයෙක් බවත් ඔහුව කඩය අසල හමුවෙලා එක්කරගෙන ගිහින් හන්දියට ඇරලවූ බවත් සඳහන් කර ඇත. ඔවුන් ගමන් කළ ජීප් රථයේ

අංකය විමසීමේදී 64-0946 දරණ ජීප් රථය බව පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති වීඩියෝ දර්ශන වලින් කඩය ඉදිරිපසින් නවතා ඇති ජීප් රථය ඔවුන් ගමන් කළ ජීප් රථය බවට පිළිගෙන ඇත. තවද එකී ජීප් රථයේ පිටුපස දොරෙන් බහින නිලධාරියා තෙවන වගඋත්තරකරු රන්දීර නිලධාරියා බවට පවසා ඇත.

In door කැමරා දර්ශනය පෙන්වා විමසීමේදී මෙම පළමු පැමිණිලිකරු අත්අඩංගුවට ගන්නා ලද්දේ මෙම කඩය අසල බවත් කඩය ඇතුලේ සිටින නිලධාරීන් තෙවන සහ සිව්වන වගඋත්තරකරුවන් බවත් පිළිගෙන ඇත.

මෙම පැමිණිලිකරුගේ අතේ තිබූ ජංගම දුරකථනය බාරයට ගන්නේ මෙම සිව්වන වගඋත්තරකරු බවත් එසේ බාරයට ගත්තේ දෙවන වගඋත්තරකරුගේ උපදෙස් පරිදි බවත් එසේ ජංගම දුරකථනය භාරයට ගන්නා අවස්ථාවේදී මෙම පළමු පැමිණිලිකරු අල්ලා ගෙන සිටින්නේ දෙවන වගඋත්තරකරු බවත් පැමිණිලිකරු මුල් අවස්ථාවේදී ජීප් රථය පසු කරමින් ස්ටේටින් ස්කූටරයෙන් කඩය දෙසට පැමිණෙන අවස්ථාවේදී පැමිණිලිකරුගෙන් වගඋත්තරකරුවන් සඳහන් කරන පරිදි ප්‍රශ්න කර සිටියේ ජීප් රථය තුළ සිට බවත් දන්තවා ඇතග

මෙම වගඋත්තරකරු කොමිෂන් සභාව ඉදිරියේදී 2026.06.18 දින පරීක්ෂණයේදී වැඩිදුර විමසීමේදී දන්වා ඇත්තේ මෙම පැමිණිලිකරුව ජීප් රථයට නංවා ගැනීමට පෙර පරීක්ෂා කිරීමක් සිදු නොවූ බවත් ජීප් රථයට නංවා ගැනීමෙන් පසුව පරීක්ෂා කිරීමක් සිදු කළ බවත් ය. තවද මෙම දින වැඩිදුර විමසීමේදී සඳහන් කර ඇත්තේ වගඋත්තරකරුවන් සමග සිටි දෙරණ නාලිකාවේ සේවය කළ පුද්ගලයා බවට පවසා සිටි පුද්ගලයා හමුවූයේ මෙම කඩය අසල නොව බවත් ඊට කලින් පෙට්ටි කඩයක් එනම් මීටර් 200 ක් පමණ දුරකින් ඇති පෙට්ටි කඩයක් අසලදී මෙම කඩය අසලට පැමිණීමට පෙර හමුවූ බවත් ය.

පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති වීඩියෝ සාක්ෂියේ පහරදීම් සිදුවන දර්ශනය පෙන්වා විමසීමේදී සඳහන් කර ඇත්තේ මෙම පළමු පැමිණිලිකරු දෙවන වගඋත්තරකරුගේ කොලරයෙන් ඇල්ලීම හේතුවෙන් ජීප් රථයට නංවා ගත් බවයි. තවද පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති නිවස ආසන්නයේ ඇති සීසීටීවී දර්ශන පෙන්වා විමසීමේදී වගඋත්තරකරුවන් සමග සිටි බාහිර පාර්ශවකරු එම අවස්ථාවේද ඔවුන් සමග සිටි බවට පිලිගන්නා ලදී.

පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත සඳහන් කර ඇති පරිදි මෙම පැමිණිලිකරු අඳුරු පිට්ටනියකට රැගෙන ගොස් අමානුෂික ලෙස පහරදීමක් සිදු කළ බවට සඳහන් කර ඇති චෝදනාව සම්බන්ධව විමසීමේදී එවැනි දෙයක් සිදු නොවූ බවට ප්‍රකාශ කර ඇත.

<u>පස්වන වගඋත්තරකාර ගරුමුනි දනුෂිකා ගීතානි ද සොයිසා යන අයගේ කරුණු දැක්වීම :</u>

මෙම සිද්ධිය සම්බන්ධයෙන් ඇය කිසිම දෙයක් නොදන්නා බවත් මෙම සිද්ධිය සිදුවූ දිනට පෙර දින එනම් 2023.10.16 දින උප සේවක ලෙස රාජකාරි ඉටු කළ බවත් එම රාජකාරිය එදින උදේ 6.00 සිට සවස පැය 18.00 දක්වා බවත් ඉන් අනතුරුව රාජකාරිය නිමවී පොලිසියේම දෙවන මහලේ පිහිටා තිබෙන තනිකඩ හට නිවාසයට ගිය බවත් එදින පැය 21.00 ට රාත්‍රී නාම ලේඛනයට පෙනී සිට නැවත හට නිවාසයට ගොස් විවේකය ලබා ගන්නා ලද බවත් ප්‍රකාශ කර ඇත. 2023.10.17 දින උදේ 6.11 ට රාජකාරිය සඳහා වාර්තා කළ බවත් එකී තොරතුරු ආර්අයිබී තොරතුරු පොතේ 50 පිටුවේ ඡේද අංක 2064 යන ලේඛනය යටතේ ඇතුළත් කර තිබෙන බවත් එදින දුරකථන ක්‍රියාකරු ලෙස රාජකාරි ඉටු කළ බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

2023.10.17 දින ඇය සේවයට වාර්තා කරන ලද පෙ.ව.6.11 ට කලින් කිසියම් නිල රාජකාරියක් සඳහා පැමිණෙන ලෙසට දැනුම්දීමක් සිදු කර තිබේද යනුවෙන් විමසීමේදී ඇය විසින් ප්‍රකාශ කර ඇත්තේ එවැනි කිසිදු දැනුම්දීමක් නොලැබුණු බවත් එවැනි කිසිදු රාජකාරියක් සඳහා ඇය නොගිය බවත්ය. තවද මෙම පැමිණිල්ලේ සඳහන් සිදුවීම පිළිබඳව ඇය දැනුවත් වී සිටියේද යනුවෙන් ප්‍රශ්න කිරීමේදී ඇය විසින් ප්‍රකාශ කර ඇත්තේ මෙම සිද්ධිය සම්බන්ධයෙන් කිසිවක් දැන නොසිටි බවත් මුහුණු පොතේ මේ පිළිබඳව උඩුගත කිරීමෙන් පසුව දැන ගැනීමට ලැබුණු බවත් ප්‍රකාශ කර ඇත.

තවද මෙම නිලධාරිණිය විසින් 2023.10.17 දින පැමිණිලිකරුගේ බිරිඳ වන රෂා හසීනා යන කාන්තාව පරීක්ෂා කළාද යනුවෙන් ප්‍රශ්න කිරීමේදී ඇය විසින් "නැත" යනුවෙන් උත්තර ලබාදී ඇත. වැඩිදුර ප්‍රශ්න කිරීමේදී මෙම නිලධාරිණිය විසින් ප්‍රකාශ කර ඇත්තේ 2023.10.17 දින ඇය පැය 18.00 ට පමණ එදින රාජකාරිය නිම කළ බවත් කැස්බෑව පොලිස් ස්ථානයේ නිලධාරීන්ට විරුද්ධව සිදු කර ඇති පහරදීමේ චෝදනාව සම්බන්ධයෙන් ඇය නොදැනුවත් බවට වැඩිදුරටත් කරුණු ඉදිරිපත් කර ඇත.

*<u>අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන් කරුණු</u>*

අධිකරණ වෛද්‍ය පෝරම් අංක 1694/23, නිකුත් කළ දිනය 2023.10.18 යන වාර්තාවේ නම ලෙස සඳහන් කර ඇත්තේ වන්නිආරච්චිලාගේ අදීෂ උපශාන්ත වයස 25 ජාතික හැඳුනුම්පත් අංකය 980820122 v රෝහලට ඇතුළත් වූ දිනය 2023.10.17, ඇතුළත් වූ වේලාව පැය 17.28 ඇද ඉහපත් අංකය 133167/23 පරීක්ෂා කළ දිනය 2023.10.18 පරීක්ෂා කළ වෙලාව පෙ.ව. 10.15. එම වාර්තාවේ ඉතිහාසය යන කොටසේ සඳහන් වී ඇත්තේ

> "17.10.2023 උදේ 2.00 ත් 2.30 ත් අතර කැස්බෑවේදී අපේ ගේ ළඟ ඉඳලා මීටර් 200 විතර දුරින් තියෙන නයිට් කඩයට skating scooter එකක මම ගියා. කඩය ගාව පොලිස් ජීප් එකක් තිබුණා. පොලිසියේ uniform 03, සිවිල් 01 ඉඳලා ප්‍රශ්න කළා. මට ජීප් එකට නගින්න කිව්වා. මම බෑ කියලා කඩය ඇතුළට ගියා. ඒ ගොල්ලෝ 4 දෙනා මම අත් කකුල් වලින්

උස්ස ගෙන ගිහිල්ලා ජීප් එකේ පිටුපසට දැම්මා. ජීප් එකට දා ගන්න කලින් අත් ඉස්සරහට දාලා මාංචු දැම්මා කඩය ඇතුලෙදී. ජීප් එකේ යන ගමන් අත් පිටුපසට කරලා මාංචු දැම්මා. වාහනයේ යන ගමන් අතින් පයින් ඇගට ගැහුවා. කොන්ඩෙන් ඇද්දා. මාව ජීප් එකෙන් කැස්බෑව පොලීසිය පහු කරගෙන (මට පෙන්නුවා කැස්බෑව පොලීසිය පහු වෙනකොට ) ඒ ලග පාලු පිට්ටනියකට අරගෙන ගියා. ජීප් එක පිට්ටනිය මැද නවත්වා මාව බැස්සුවා. යුනිෆෝම් හිටිය පොලිසියේ එක්කෙනෙක් ටී 56 එකක් මගේ ඔළුවට තිබ්බා. මට දණ ගහපන්, බිම දිගාවෙයන් කියලා මට එක එක ඉරියව්වෙන් ඉන්න කියලා කිව්වා. මාව මරණවා කියලා කිව්වා. ග්‍රවුන්ඩ් එකේදී අතින් පයින් ගහන්න ගත්තා. කම්මුලට, ඔළුවට, පිටට ගැහුවා. මූනින් අතට දිගා කරලා බිම හාන්සි කරලා පයින් පිටට හොදටම ගැහුවා. හෝස් බටයකින් ඉනේ පිටුපසට හොදටම ගැහුවා. ගණන් කර ගන්න බැරි තරමට ග්‍රවුන්ඩ් එකේදී විනාඩි 10-15 ක් ගැහුවා. (අත්පිටුපසට කරලා මාංචු දාලා තිබ්බෙ) අල්විස් කියන Officer phone එකේ flash එක ගහගෙන හිටියා. ටී 56 තුවක්කු මිටෙන් ඇන්නා. මට ගහන ගමන් කිව්වා මට කැස්බෑව ගමෙන් යන්න කියලා. තුවක්කු ලෝඩ් කරන ගමන් මාව මරණව කියල කිව්වා කඩේ සීසීටීවී තිබුණේ නැත්නම්. ඊට පසුව මාව වාහනයට දා ගත්තා. දා ගත්ත ගමන් ඉදලා මගෙන් ප්‍රශ්න කළා. යන ගමන් ආයෙත් තුවක්කුව එලියට තියලා ෆෝන් එක අන්ලොක් කරලා ඉල්ල ගත්තා. මම බයට අයිස් ගහනව කියලා පිලිගත්තා. ඊට පස්සේ ගෙදර ඉස්සරහට ගියා. පොලීසියේ 3 ක් ගෙදරට ගියා. ඊට පස්සෙ මාව ගෙදරට අරගෙන ගියා. ඊට පස්සෙ මායි වයිෆුයි මගේ යාළුවෝ දෙකයි ඇරස්ට් කළා. අපිව කැස්බෑව පොලීසියට අරගෙන ගියා. අපි පිරිමි තුන් දෙනා කූඩුවට දැම්මා. උදේ කැස්බෑව උසාවියට දැම්මා. අපිට ඇප හම්බ වුනා. "

එකී අධිකරණ වෛද්‍ය වාර්තාවේ වෛද්‍යවරයාගේ නිරීක්ෂණය පහත පරිදි ඉදිරිපත් කර ඇත.

*Head and Face:*

1. *A periorbital contusion bluish black in color measuring 4 cm x 3cm was situated on the lower aspect of the left eye. No associated sub conjunctival hemorrhages were present.*
2. *A group of discrete small contusions, red in color with their sizes varying from 1cm x 0.5cm to 1 cm x 3 cm was dispersed in an area measuring 11cm x 7cm on the left side of the face.*
3. *A contusion, red in color measuring 2cm x 0.5cm was situated on the back aspect of the left ear lobe.*
4. *A contusion, bluish red in color measuring 1cm x 1cm was situated on the back side of the head overlying the left mastoid process.*

5. *A group of small contusions, red in color with their sizes varying from 1cm x 1cm to 1cm x 205cm was dispersed in an area measuring 11cm x 15cm on the right side of the face.*
6. *A contusion, bluish red in color was situated on the back aspect of the right ear lobe.*
7. *A contusion, bluish red in color measuring 1cm x 0.5cm was situated on the back of the head overlying the right mastoid process.*

*Neck:*

8. *A group of discrete small contusions, red in color with their sizes varying from 1cm x 0.5cm to 1cm x 3 cm was dispersed in an area measuring 10cm x7cm*

*Upper limbs*

09. *A group of concrete contusions, red in color with their sizes varying from 0.5 cm x 0.5 cm to 1 cm x 0.5 cm was situated on the back aspect of the right arm.*

10. *An overlapping two patterned contusions, bluish red in color dispersed in an area of 11 cm x 8 cm were situated on the back aspect of the mind third of the left arm.*

11. *A linear abrasion with wet scab was present on the back aspect of the upper third of the right forearm.*

12. *A linear abrasion measuring 3.5 cm in length was situated on the inner aspect of the right wrist. Associated swelling with redness was present around the wrist.*

13. *A conclusion, red in color measuring 3 cm x 2 cm was situated on the outer aspect of the right wrist. Associated swelling with redness was present around the wrist.*

*Chest*

14. *An irregular contusion bluish – red in color measuring 7 cm x 3 cm was situated on the back aspect of the left shoulder.*

15. *An irregular contusion bluish in color measuring 5 cm x 2.5 cm was situated on the back aspect of the right – side upper chest.*

16. *An irregular diffuse contusion bluish purple in color measuring 20 cm x 12 cm was situated on the back aspect of the lower right – side chest.*

*Abdomen – No injuries were present.*

*Back and buttocks*

17. *A group of overlapping contusions, bluish red in color dispersed in an area measuring 24 cm x 15 cm was situated on the left side of the buttocks and outer aspect of the upper third of the left thigh.*

*Lower limbs*

19. *A group of overlapping contusions, bluish red in color dispersed in an area measurement 2 cm x 15 cm situated on the inner and back aspects of the lower two thirds of the right third.*

20. *A contusion measuring 4 cm x 3 cm was situated on the back aspect of the lower third of the right thigh. an abrasion with wet scab measuring 2 cm x 2 cm was situated on the skin overlaying the contusion.*

21. *An abrasion with wet scab measuring 3 cm x 2 cm was situated on the front aspect of the right knee.*

22. *A contusion, bluish red in color measuring 5 cm x 3 cm was situated on the outer aspect of the upper third of the left leg.*

*Investigations*

01. *FAST (focus assessment with sonography for trauma) done at the admission was negative.*
02. *X-ray No. 76989 of skull, cervical spine, chest, lumbo – sacral spine, pelvis, right and left knee joints and right and left wrists – No fractures were present.*
03. *Creatinine kinase (CK) levels – 1037.1 U/L (normal expected values < 171.0 U/L)*

*පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති වීඩියෝ සාක්ෂි*

01 Indoor CCTV footage

- එක් පොලිස් නිලධාරියෙකු වෙලාව 2.41 ට කඩයට ඇතුලු වන බව
- තවත් එක් නිලධාරියෙකු වෙලාව 2.42 ට කඩයට ඇතුලු වන බව සහ එම නිලධාරියා වෙලාව 2.43 ට එම කඩයෙන් එලියට යන බව
- මුලින්ම කඩයට ඇතුලු වූ නිලධාරියා වෙලාව 2.44 ට කඩයෙන් එලියට යන බව

- වෙලාව 2.46 වන විට පැමිණිලිකරු කොට කලිසමක් සහ ටී ෂර්ට් එකක් ඇද ස්කේටින් ස්කූටරය සමග කඩය අසලට පැමිණ එකී ස්කූටරය බිම තියලා සාක්කුවෙන් ජංගම දුරකථනය එලියට ගන්නා බව
- එම අවස්ථාවේදී එක් නිලධාරියෙකු පැමිණ පැමිණිලිකරුගේ ටීෂර්ට් එකෙන් අදින්න උත්සාහ කරන බව
- ඉන් අනතුරුව පැමිණිලිකරු කඩය ඇතුළට පැමිණීමෙන් පසු ඔහු පසුපසින්ම ටී ෂර්ට් එකෙන් ඇදපු නිලධාරියා ද කඩය තුළට පැමිණෙන බව
- එම ස්ථානයට මුල් අවස්ථාවේදී කඩය තුලට පැමිණ සිටි නිලධාරීන් දෙදෙනාගෙන් එක් නිලධාරියෙකු කඩය තුළට පැමිණෙන අතර අනෙකුත් නිලධාරියා කඩයට ඇතුල් නොවී කඩය ඉදිරිපිට සිටින බව
- කඩය තුළ සිටින නිලධාරීන් දෙදෙනාගෙන් එක් නිලධාරියෙකු පැමිණිලිකරුගේ බෙල්ලෙන් අල්ලා ගෙන සිටින බවත්, අනෙකුත් නිලධාරියා ඔහුගේ අතින් අල්ලා ගෙන ඔවුන් දෙදෙනා විසින්ම පැමිණිලිකරු අදින බවත් පැමිණිලිකරුගේ අතේ තිබෙන ජංගම දුරකථනය උදුරා ගැනීම
- එම අවස්ථාවේදී කඩයට ඉදිරිපස සිටින නිලධාරියා විසින් මාංචුව ගෙනවිත් පැමිණිලිකරුගේ අත් දෙකට දාන බව
- පසුව පැමිණිලිකරුව කඩයෙන් එලියට එක්කරගෙන යාමේදී පැමිණිලිකරුට මාංචු දැමූ නිලධාරියා විසින් පැමිණිලිකරුව පිටුපසින් තල්ලු කරන බව සහ බෙල්ලෙන් අල්ලා ගෙන තල්ලු කරන ලද නිලධාරියා විසින් ඔහුට පිටුපසින් පහරක් ගසන බව

01 Outdoor CCTV footage:

- වෙලාව 2.32 ට අංක 64 – 0946 දරණ පොලිස් ජීප් රථයක් කඩයක් අසල පැමිණ නවත්වන බව
- එකී කඩය අසල තවත් පුද්ගලයින් කිහිපදෙනෙකු සිටින බව
- එම ජීප් රථයෙන් නිලධාරීන් දෙදෙනෙකු එළියට බැස එන බව
- ඉන් අනතුරුව පිටුපස දොර ඇරගෙන තවත් එක් නිලධාරියෙකු සමග සිවිල් ඇඳුමින් සැරසී (කලු පැහැති ටී ෂර්ට් එකක්) තව එක් පුද්ගලයෙකු බැස එන බව
- පොලිස් යුනිෆෝම් ඇද සිටින නිලධාරීන් තිදෙනා ජීප් රිය අසල කලුවර ස්ථානයක රැදී සිටින අතර සිවිල් ඇද සිටි පුද්ගලයා කඩය තුළට යන බව
- පසුව නිලධාරීන් තිදෙනාම ජීප් රථයට නගින බව (එක් නිලධාරියෙකු පිටුපස දොරෙන් නගින බවත් අනෙකුත් නිලධාරීන් දෙදෙනා ඉදිරිපසට ගොස් නගින බව
- වෙලාව 2.44 වන විට පැමිණිලිකරු ජීප් රථය පසු කරගෙන පැමිණ ස්කේටින් ස්කූටරය නවත්වා ජීප් රථය දෙස හැරී බලන බව

- පසුව ජීප් රථය දෙසට යන බව, විනාඩි දෙකකට ආසන්න කාලයකින් පසුව කඩය දෙසට පැමිණෙන බව
- එම අවස්ථාවේදී ජීප් රථයේ පිටුපස දොර ආසන්නව පැමිණිලිකරු එමින් සිටියදී සිවිල් ඇඳුමින් සිටි පුද්ගලයා විසින් (මුල් අවස්ථාවේ දී ජීප් රථයෙන් පොලිස් නිලධාරීන් සමග පැමිණෙන ලද පුද්ගලයා ) පැමිණිලිකරුට ජීප් රථයට නගින ලෙසට ඔළුවෙන් සංඥා කරමින් පිටුපස දොර ඔහු විසින්ම විවෘත කරන බව
- පසුව ජීප් රථයේ ඉදිරිපස අසුනේ සිටි නිලධාරියා විසින් පැමිණිලිකරුගේ ටීෂර්ට් එකෙන් අදින බව
- කඩය ඉදිරිපස සිටි නිලධාරියා වෙත ඉහත කී සිවිල් පිට සිටි පුද්ගලයා ජීප් රිය තුලදී තිබූ මාංචුවක් ගෙනවිත් අතට ලබා දෙන බව
- ජීප් එකට නංවන අවස්ථාවේදී යුනිෆෝම් ඇඳපු නිලධාරීන් තිදෙනා විසින්ම පැමිණිලිකරුට පහර දෙන බව එක් නිලධාරියෙකු පැමිණිලිකරුගේ කකුල ඔසවා ජීප් රියට දමන බව
- පැමිණිලිකරුට මාංචු දමා ගෙන අතින් පයින් එම නිලධාරීන් තිදෙනා විසින්ම පහර දෙන බව
- ඉන් පසුව පැමිණිලිකරුව ජීප් රියට නංවා ගෙන එම නිලධාරීන් තිදෙනා සමග ඉහත කී සිවිල් ඇඳගත් පුද්ගලයා ද ජීප් රථයේ පිටුපස දොරෙන් ඇතුලු වී ගමන් කරන බව

3. නිවස ආසන්නයේ පිහුටුවා ඇති CCTV කැමරාවේ පටිගත වී තිබූ දර්ශන:

- 2023.10.17 පෙ.ව. 3.20 ට වගඋත්තරකාර පාර්ශවකරුවන් ගමන් කරන ලද ජීප් රථය ළගා වන බව
- වගඋත්තරකරුවන් දෙදෙනෙකු සහ සිවිල් ඇඳුමින් සැරසී සිටි පුද්ගලයා ජීප් රථයෙන් බහින බව
- රියදුරු අසුනේ සිටි නිලධාරියා විදුලි පන්දමක් සහිතව ජීප් රථයේ පිටුපස දොර අසලට පැමිණෙන බව
- එම නිලධාරියා ජීප් රථය තුළට විදුලි පන්දම අල්ලා ගෙන සිටීමේදී පැමිණිලිකරු ජීප් රථයේ බිම වාඩිවී සිටින බව
- වගඋත්තරකාර පාර්ශවකරුවන් දෙදෙනෙකු සහ සිවිල් ඇඳුමින් සිටි පුද්ගලයා පැමිණිලිකරුගේ නිවස දෙසට යන බව (සීසීටීවී කැමරාව ආවරණය වන ස්ථානයෙන් බැහැරව යන බව)
- ඉහත කී වගඋත්තරකරුවන්න දෙදෙනා එම ස්ථානයෙන් ඉවත්ව යාමෙන් අනතුරුව එක් වගඋත්තරකාර පාර්ශවකරුවෙකු ජීප් රථය අසළ සිටින බව

- සිවිල් පිට සිටි පුද්ගලයා නැවත ජීප් රථය අසලට පැමිණ පැමිණිලිකරු ජීප් රථයෙන් බස්සවාගෙන එතන සිටි වගඋත්තරකරු සමග පැමිණිලිකරුගේ නිවස දෙසට යන බව
- පෙ.ව. 3.42 ට පමණ 1, 2 පැමිණිලිකරුවන් සමග එක් වගඋත්තරකරුවෙකු සහ සිවිල් ඇඳුමින් සිටි පුද්ගලයා නැවත ජීප් රථය දෙසට පැමිණෙන බව
- පෙ.ව. 3.44 ට පමණ පැමිණිලිකරුවන්ගේ මිතුරන් දෙදෙනා සමග අනෙකුත් වගඋත්තරකරුවන් දෙදෙනා ජීප් රථය අසළට පැමිණෙන බව
- පෙ.ව 3.45 ට වගඋත්තරකාර පාර්ශවකරුවන් ගමන් කරන ලද ජීප් රථය එම ස්ථානයෙන් පිටත් වන බව සහ එම අවස්ථාවේ සිවිල් ඇඳුමින් සිටි පුද්ගලයා ද එම ජීප් රථයට නගින බව

***<u>කොමිෂන් සභාවේ නිරීක්ෂණ :</u>***

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ඉහත පැමිණිල්ල සම්බන්ධව සළකා බැලිය යුත්තේ, පැමිණිලිකරුවන් තිදෙනා අත්අඩංගුවට ගැනීමට සාධාරණ හේතුවක් තිබුණාද, එසේ තිබුණේ නම්, එම හේතුව පැමිණිලිකරුගේ අත්අඩංගුවට ගැනීමට පෙර පැමිණිලිකරුවන්ට දන්වා තිබේද සහ පැමිණිලිකරුවන් තිදෙනා වදහිංසාවට හෝ අමානුෂික ලෙස හෝ අවමන් සහගත සැලකිල්ලකට ලක් වී තිබේද යන්න වේ.

ඉහත පැමිණිල්ල, පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇතිපැමිණිල්ල, දිවුරුම් ප්‍රකාශ, ඡායාරූප සහ වීඩියෝ සාක්ෂි වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශය, වගඋත්තරකරු විසින් මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති උද්‍යත සහ අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව පහත කරුණු නිරීක්ෂණය වේ.

පළමු පැමිණිලිකරු විසින් මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති ඡායාරූප සළකා බැලීමේදී එම ඡායාරූප පැමිණිලිකරු සිරමැදිරියේ සිටින අවස්ථාවේ ඡායාරූප ගතකර ඇති අතර එම ඡායාරූපවලින් මෙම පැමිණිලිකරුගේ අතේ වැලමිට සහ උරහිස ප්‍රදේශය අතර, කකුලේ කලව ප්‍රදේශයේ පිටුපස සහ පිට ප්‍රදේශයේ පහර දුන් බවට සලකුණු නිරීක්ෂණය වේ. තවද පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති ඡායාරූප වලින් එක් ඡායාරූපයක් රෝහල් ගතවී සිටින අවස්ථාවේ පාදය බැන්ඩේජ් කර ඇති බවට නිරීක්ෂණය වේ.

කැස්බෑව පොලිසියට අනුයුක්තව සේවය කරන ඔලබොඩුවගේ යසසිරි ගාමිනී අල්විස් මයා, විතාරනගේ ප්‍රභාත් රන්දීර මයා, විජේසූරිය ආරච්චිගේ සචිරු මධුශංක මයා යන නිලධාරීන් නිල ඇඳුමින් සැරසී 2023.10.16 දින රාත්‍රී ජංගම සංචාරයේ යෙදී සිට ඇති අතර එම සංචාරය සඳහා පිටව ගොස් ඇත්තේ අංක 64-0946 දරණ ජීප් රථයෙන් බවත් එකී ජීප් රථයේ රියදුරු ලෙස එදින

රාජකාරියේ යෙදී ඇත්තේ පො.කො.රි. 98994 මදුසංක යන නිලධාරියා විසින් බවත් අත්විලංගු, ටී - 56ගිණි අවිය ද රැගෙන ගොස් ඇති බවටද නිරීක්ෂණය වේ.

එම නිලධාරීන් එදින රාත්‍රී සංචාරයේ දී 2023.10.17 දින අලුයම 2.30 ට පමණ රාත්‍රී කාලයේ පවතින කෑම කඩයක් අසල එකී ජීප් රථය නවත්වා ඉදිරිපස දෙපැත්තේ දොර ඇරගෙන නිල ඇඳුමින් සැරසී දෙවන සහ සිව්වන වගඋත්තරකරුවන් දෙදෙනා සහ පිටුපස දොර ඇරගෙන නිල ඇඳුමින් සැරසුන තෙවන වගඋත්තරකරු සමග සිවිල් ඇඳුමින් සැරසුනු එක පුද්ගලයෙකු ද බහින බවත්, එම අවස්ථාවේදී එම කඩය අසල තවත් පුද්ගලයින් තිදෙනෙකු පමණ සිටින බවට පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති වීඩියෝ සාක්ෂි අනුව නිරීක්ෂණය කළ හැක.

එකී කඩයට වගඋත්තරකරුවන් දෙදෙනෙකු පමණක් ඇතුල් වී පසුව එම කඩයෙන් එළියට ගොස් වගඋත්තරකරුවන් තිදෙනා එම ස්ථානයේ කලුවර ප්‍රදේශයක රැඳී සිටීමෙන් පසුව සිවිල් පිට සිටි පුද්ගලයා කඩය ඇතුළට ගොස් නැවත පැමිණීමෙන් පසුව සංචාරයේ යෙදී සිටි උක්ත වගඋත්තරකරුවන් තිදෙනාගෙන් පො.කො.රි. මධුශංක (සිව්වන වගඋත්තරකරු) සහ පො.සැ. අල්විස් (දෙවන වගඋත්තරකරු) ඉදිරිපස දොරටුවෙන් සහ රන්ධීර නිලධාරියා (තෙවන වගඋත්තරකරු) පිටුපස දොරෙන්ද ජීප් රථයට නැගීමෙන් පසුව වෙලාව පෙ.ව 2.44 ට පමණ පළමු පැමිණිලිකරු එම ස්ථානයට ස්කේටින් ස්කූටරයක ජීප් රථය පසු කරගෙන කඩය දෙසට පැමිණෙන බවට ඉදිරිපත් කර ඇති වීඩියෝ සාක්ෂි අනුව තවදුරටත් නිරීක්ෂණය කළ හැක.

එසේ පැමිණෙන මෙම පැමිණිලිකරු එකවරම එකී ස්කූටරය නවත්වා ජීප් රථය දෙස හැරී බලා ජීප් රථය අසලට යන බවත් විනාඩි දෙකකට ආසන්න කාලයකින් පසුව කඩය දෙසට නැවත පැමිණෙන අවස්ථාවේ දී (ජීප් රථයේ පිටුපස දොර ආසන්නව) ජීප් රථයේ සිට සිවිල් ඇඳුමින් එළියට බහින ලද පුද්ගලයා විසින් ජීප් රථයට නගින ලෙසට සංඥාවෙන් පෙන්වමින් ජීප් රථයේ පිටුපස දොර අරින ලද නමුත්, මෙම පැමිණිලිකරු එය නොසළකා කඩයට ඇතුල්වන බවට ද ඉදිරිපත් කර ඇති වීඩියෝ සාක්ෂි අනුව නිරීක්ෂණය කළ හැක.

තවද, මෙම පැමිණිලිකරු කඩයට ඇතුළුවන අවස්ථාවේ ඔහුගේ පසුපසින්ම ඉහත කී දෙවන සහ සිව්වන වගඋත්තරකරුවන් දෙදෙනා කඩයට ඇතුළු වී ඉන් දෙවන වගඋත්තරකරුවෙකු මෙම පැමිණිලිකරුගේ බෙල්ලෙන් අල්ලාගෙන සිටින බවත් එම වගඋත්තරකරුවන් දෙදෙනා විසින්ම මෙම පැමිණිලිකරු අදින බවත් පැමිණිලිකරුගේ අතේ තිබෙන ජංගම දුරකථනය සිව්වන වගඋත්තරකරු විසින් ගන්නා බවත් සිවිල් පිට සිටින පුද්ගලයා ජීප් රථය තුළ තිබෙන මාංචුවක් රැගෙන විත්, එම අවස්ථාවේ දී කඩයේ ඉදිරිපස සිටින තෙවන වගඋත්තරකරුගේ අතට දෙන බවටත් ඉදිරිපත් කර ඇති වීඩියෝ සාක්ෂි අනුව නිරීක්ෂණය වේ.

පසුව එම වගඋත්තරකරුවන් විසින් මෙම පැමිණිලිකරුගේ අත්දෙකට මාංචුව දමා කඩයෙන් එළියට තල්ලු කර ජීප් රථයේ පිටුපස දොර අසලදී දෙවන, තෙවන සහ සිව්වන වගඋත්තරකරුවන් තිදෙනා

විසින්ම මෙම පැමිණිලිකරුට අතින් හා පයින් පහර දෙන බවටත්, එක් නිලධාරියෙකු විසින් මෙම පැමිණිලිකරුගේ කකුල ඔසවා ජීප් රියට තල්ලු කරන බවත් වගඋත්තරකරුවන්ගේ පහර දීමෙන් පසුව පැමිණිලිකරු ජීප් රථයට නංවා ගැනීමෙන් පසුව වගඋත්තරකරුවන් තිදෙනා සමග සිවිල් ඇඳුමෙන් සිටි පුද්ගලයාද ජීප් රථයේ පිටුපස දොරෙන් රථයට නැග යන බවත් නිරීක්ෂණය වේ.

මෙහිදී, පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති වීඩියෝ සාක්ෂි පිළිබඳව 2026.06.18 දින පැවති පරීක්ෂණයේදී වගඋත්තරකරුවන්ට පෙන්වා ඇත.

එදින පරීක්ෂණ කටයුතු සඳහා තෙවන වගඋත්තරකාර පාර්ශවය හේතුවක් නොදන්වා පැමිණ නොමැති අතර, දෙවන සහ සිව්වන වගඋත්තරකරුවන් දෙදෙනා පැමිණ ඇත.

එහිදී, එම වගඋත්තරකරුවන් දෙදෙනා විසින්ම ඉහත සඳහන් වීඩියෝ දර්ශනයේ Out door වීඩියෝවේ සිටින්නේ දෙවන, තෙවන සහ සිව්වන වගඋත්තරකරුවන් බවට පිළිගෙන ඇති අතර, එහිදී සිවිල් ඇඳුමින් සිටින පුද්ගලයා වගඋත්තරකාර ආයතනයේ සේවය කරන පුද්ගලයෙක් නොවන බවත්, ඔහු දෙවන වගඋත්තරකරු හඳුනන මිතුරෙකු බවත්, ඔහුගේ නම දුෂාන් බවටත් දෙරණ නාලිකාවේ සේවය කරන පුද්ගලයෙකු බවටත් ප්‍රකාශ කර ඇත.

**ඉහත සිදුවීමට අදාළව, පළමු පැමිණිලිකරු පොලිස් නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇති හේතුව පිළිබඳව මෙම කොමිෂන් සභාව අවධානය යොමු කර සිටී.**

පළමු පැමිණිලිකරු විසින් මෙම කොමිෂන් සභාව වෙත දන්වා ඇත්තේ එම පැමිණිලිකරු තාවකාලිකව පදිංචිව සිටි නිවස අසල තිබූ නයිට් කඩයකට ගිය අවස්ථාවේ එකී කඩය අසල නවත්වා තිබූ ජීප් රථය තුළ සිටි නිලධාරියෙකු විසින් පළවන පැමිණිලිකරුට කතා කර ජාතික හැඳුනුම්පත ඉල්ලා සිටි බවත්, මෙම පැමිණිලිකරු විසින් ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කරමින් තාවකාලික පදිංචි ස්ථානය ජාතික හැඳුනුම්පතෙහි සඳහන් ලිපිනය නොවන බැවින් තාවකාලික පදිංචි ස්ථානය පිළිබඳව පැහැදිලි කළ නමුත් හේතුවක් නොමැතිව ජීප් රථයට නගින ලෙසට අණ කළ බවයි.

පළමු වගඋත්තරකරු වෙනුවෙන් උප පොලිස් පරීක්ෂක පොඩිරාලහාමි යන අය විසින් මේ පිළිබඳව කොමිෂන් සභාවට ප්‍රකාශයක් ලබා දෙමින් සඳහන් කර ඇත්තේ, අවේලාවේ ගමන් කරන ලද මෙම පළවන පැමිණිලිකරු පිළිබඳව සැකයක් මතු වී, තෙවන සහ සිව්වන වගඋත්තරකරුවන් ජීප් රථයෙන් බැස ගොස් පළමු පැමිණිලිකරු පරීක්ෂා කිරීමේදී පැමිණිලිකරු ඊට ප්‍රතිරෝධ දක්වා ඇති අතර පලා යාමටද උත්සාහ කර ඇති බවත්, නිලධාරීන් තිදෙනා විසින් එම පැමිණිලිකරු පාලනය කර ගැනීමට උත්සාහ කළද ඔහු එකවරම එම ස්ථානයෙන් දුවගෙන යනවාත් සමග එම පසුපසින් නිලධාරීන් පන්නාගෙන යන අවස්ථාවේ මෙම පැමිණිලිකරු කොන්ක්‍රීට් කණුවක ගැටී වැදුණු බවත්, මෙම පැමිණිලිකරු පරීක්ෂා කිරීමේදී ඔහුගේ කලිසම් සාක්කුවේ තිබී අයිස් පැකට්ටුවක් හමු වී ඇති බවත්, ඒ අනුව වරද කියා දී අත්අඩංගුවට ගෙන ඇති බවත් ය.

දෙවන වගඋත්තරකරු වන පො.සැ. 53175 ඔලබොඩුවගේ යසසිරි ගාමිනී අල්විස් යන අය විසින් ප්‍රකාශයක් ලබා දෙමින් සඳහන් කර ඇත්තේ ඔවුන් සියලු දෙනා තේ පානය කර එළියට පැමිණෙන අවස්ථාවේ චුටි බයිසිකලයක් වගේ එකක මෙම පළමු පැමිණිලිකරු හොරණ පැත්තේ සිට එම කඩයට පැමිණි බවත් ඒ වෙලාවෙ හැටියට එම පැමිණිලිකරු සම්බන්ධයෙන් ඔවුන්ට සැකයක් මතුවූ බැවින් තෙවන වගඋත්තරකරු වෙත ලබා දෙන ලද උපදෙස් පරිදි මෙම පැමිණිලිකරු පරීක්ෂා කිරීමේදී ප්‍රතිරෝදය දැක්වූ බැවින් ජීප් රථයට නංවා ගත් බවයි.

මේ පිළිබඳව තෙවන වගඋත්තරකරු වන පො.කො. 97522, විතාරනගේ ප්‍රභාත් රන්දීර යන අය විසින් ප්‍රකාශ කර ඇත්තේ, හොරණ පැත්තේ සිට කැස්බෑව පැත්තට මෙම පැමිණිලිකරු ගමන් කරන බවට දුටු පොලිස් සැරයන් අල්විස් විසින් මෙම පළමු පැමිණිලිකරු පිළිබඳව සැකයක් මතුවූ බැවින් පැමිණිලිකරුව පරීක්ෂා කරන ලෙසට උපදෙස් ලැබීමෙන් පසුව මෙම තෙවන වගඋත්තරකරු වාහනයෙන් බැස මෙම පැමිණිලිකරුගෙන් "කොහෙද යන්නේ" යනුවෙන් විමසා සිටි බවත් ය.

පසුව එම පැමිණිලිකරුව ජීප් රථයේ ඉදිරිපස අසුනේ සිටි දෙවන වගඋත්තරකරු වන සාජන් මහතා වෙත යොමු කළ බවත්, මෙම පැමිණිලිකරු හා දෙවන වගඋත්තරකරු අතර වචන හුවමාරුවක් සිදුවූ බවත්, අනතුරුව මෙම පැමිණිලිකරු 'යම්කිසි' දෙයක් පාවිච්චි කරන බවට සැකයක් තිබෙන බැවින් ජීප් රථයට නංවා ගන්නා ලෙසට දෙවන වගඋත්තරකරු පැවසූ බවත්, සිව්වන වගඋත්තරකරුගේ සහයෝගයක් ලබා ගෙන ජීප් රථයට නංවා ගත් බවත් ය.

වැඩිදුර විමසීමේදී මෙම වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත්තේ, පළවන පැමිණිලිකරුගෙන් ජාතික හැඳුනුම්පත ඉල්ලා සිටියේ ජීප් රථයට නංවා ගැනීමෙන් පසුව බවත්, කිසිදු අවස්ථාවක තෙවන වගඋත්තරකරු විසින් පළවන පැමිණිලිකරු පරීක්ෂා කිරීමක් සිදු නොකළ බවත්, අනෙකුත් වගඋත්තරකරුවන් දෙදෙනා විසින් මෙම පැමිණිලිකරු පරීක්ෂා කළ බවට මෙම තෙවන වගඋත්තරකරු නොදුටු බවත් වැඩිදුරටත් දන්වා ඇත.

මේ පිළිබඳව සිව්වන වගඋත්තරකරු වන පො.කො.රි. 98994,විජේසූරිය ආරච්චිගේ සචිරු මධුශංක යන අය විසින් ප්‍රකාශ කර ඇත්තේ, මෙම වගඋත්තරකරු විසින් මෙම පැමිණිලිකරුගෙන් "ගෙවල් කොහෙද " යනුවෙන් මුලින්ම අසා සිටි බවත් එම අවස්ථාවේදී මෙම පැමිණිලිකරු කෑ ගසමින් තමන් මියුසික් කාරයෙක් බවත් එම ප්‍රදේශයේ නවාතැන් ගෙන සිටින බවට ප්‍රකාශ කළ බවත් ය.

පසුව දෙවන වගඋත්තරකරු විසින් පළවන පැමිණිලිකරුව පරීක්ෂා කරන ලෙසට තෙවන වගඋත්තරකරු වෙත දැනුම්දීම හේතුවෙන් තෙවන වගඋත්තරකරු විසින් මෙම පැමිණිලිකරුව පරීක්ෂා කිරීමේදී පොර බැදීමක් සිදුවුන බවත් එම අවස්ථාවේදී දෙවන වගඋත්තරකරු සමග සිව්වන වගඋත්තරකරු ද වාහනයෙන් බැස ගොස් පැමිණිලිකරුව ජීප් රථයට නංවා ගත් බවත් වැඩිදුරටත් දන්වා ඇත.

මෙම පළවන පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට හේතුව පිළිබඳව විමසීමේදී සිව්වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත්තේ, පළවන පැමිණිලිකරු සන්තකයේ තිබී බීඩිත් සමග අයිස් කැල්ලක් තෙවන වගඋත්තරකරුට හමුවූ බැවින් බවත් ය.

වගඋත්තරකාර පාර්ශවය විසින් මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇති උද්‍යෘත වාර්තාව කෙරෙහි මෙම කොමිෂන් සභාවේ අවධානය යොමු කරන ලදී. එහිදී රාත්‍රී ජංගම සංචාර නිලධාරීන්ගේ පැමිණීම දිනය 2023.10.17 වේලාව : 06.15 පිටුව 296, ඡේදය 346 යන පිටුවේ සඳහන් කර ඇත්තේ. පැය 0310 ට පමණ කැස්බෑව 14 කණුව ප්‍රදේශයේ සංචාරය කරන විට කැස්බෑව ඩිපෝව ඉදිරිපිටදී පුද්ගලයෙකු සැක සහිත ලෙස ගමන් කරමින් සිටි අතර ඔහු නවතා ප්‍රශ්න කිරීමේදී නිලධාරීන් සමග ආරවුලට පැමිණ ඇති අතර ඔහු නවතා පරීක්ෂා කිරීමේදී පැමිණිලිකරු ඇද සිටි කලිසම් සාක්කුවේ තිබී අයිස් පැකට් එකක් හමුවූ බවත්, වරද කියා දී අත්අඩංගුවට ගන්නා ලද බවයි.

මෙහිදී පළමු, දෙවන වගඋත්තරකරුවන් විසින් සඳහන් කර ඇති පරිදි පැමිණිලිකරු අවේලාවේ ගමනක යෙදී සිටීම හේතුවෙන් ඔහු පිළිබඳ සැකයක් මතු වූ බැවින් පරීක්ෂා කිරීමට ලක් කර තිබුණේ නම් මෙම පැමිණිලිකරු එම ස්ථානයට පැමිණීමට පෙර එම කැම කඩය අසල සිටි පුද්ගලයින් සියලු දෙනා සම්බන්ධව පොලිසියට සැකයක් මතුවී ඔවුන් සියළු දෙනා පරීක්ෂා කළයුතුව තිබූ නමුත් එසේ සිදුවී නොමැති බවට පැමිණිල්ල විසින් ඉදිරිපත් කර ඇති වීඩියෝ සාක්ෂි අනුව නිරීක්ෂණය වේ.

තවද උක්ත වගඋත්තරකරුවන් විසින් අවේලාව ලෙස සඳහන් කර ඇත්තේ පෙ.ව.2.30 - 3.30 අතර කාලය වන බවට මෙම සිදුවීමට අදාළව ඉදිරිපත් කර ඇති සාක්ෂි අනුව නිගමනය කළ හැකිය. නමුත් එම වේලාවේ ගමන් කිරීම තහනම් බවට නීතියක් නොමැති අතර, එවැනි වෙලාවක ගමන් කරන පුද්ගලයෙකුගෙන් නිසි පරිදි අනන්‍යතාවය තහවුරු කර ගැනීම පොලිස් නිලධාරීන්ගේ රාජකාරිය වේ.

මෙහිදී පළමු පැමිණිලිකරු විසින් මෙම කොමිෂන් සභාව වෙත දන්වා ඇත්තේ ඔහුගෙන් මුල් අවස්ථාවේදීම ජීප් රථයේ සිටි වගඋත්තරකරුවෙකු විසින් ජාතික හැඳුනුම්පත් ඉල්ලා සිටි බවත් එකී ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීමෙන් පසුව එහි සඳහන්ව තිබෙන්නේ පළමු පැමිණිලිකරුගේ ස්ථිර පදිංචිය වූ දෙහිවල ප්‍රදේශයට අදාළ ලිපිනයක් බැවින් මෙම පැමිණිලිකරු තාවකාලිකව පදිංචිව සිටින ස්ථානය පිළිබඳව පැහැදිලි කිරීමක් සිදු කළ බවයි.

මෙහිදී වගඋත්තරකරුවන් විසින් කොමිෂන් සභාව ඉදිරිපිටදී ලබාදී ඇති ප්‍රකාශ වල හෝ පළමු වගඋත්තරකරු විසින් ඉදිරිපත් කර ඇති උද්‍යෘත වල හෝ මෙම පැමිණිලිකරු ඔහුගේ අනන්‍යතාවය තහවුරු නොකළ බවට හෝ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත් ඉල්ලා සිටීමේදී එය ප්‍රතික්ෂේප කිරීමක් සිදු කළ බවට හෝ සඳහන් කර නොමැත. තවද තෙවන වගඋත්තරකරු විසින් ලබාදී ඇති ප්‍රකාශයෙන් මෙම පැමිණිලිකරු ජීප් රථයට නංවා ගැනීමෙන් අනතුරුව ඔහුගෙන් ජාතික හැඳුනුම්පත් ඉල්ලා සිටි බවට ප්‍රකාශ කර ඇති අතර, එසේ ඉල්ලා සිටීමේදී පළමු පැමිණිලිකරුගේ අනන්‍යතාවය තහවුරු නොකළ බවට කරුණු ඉදිරිපත් කර නොමැත.

තවද, පැමිණිලිකරු විසින් ජාතික හැඳුනුම්පත් ඉදිරිපත් කළ බවට ලබාදී ඇති ප්‍රකාශය ද මෙම වගඋත්තරකරුවන් විසින් ප්‍රතික්ෂේප කර නොමැත. ඒ අනුව පළමු පැමිණිලිකරු විසින් සඳහන් කර ඇති ආකාරයට මෙම පැමිණිලිකරු විසින් වගඋත්තරකරුවන්ට ඔහුගේ අනන්‍යතාවය තහවුරු කළ බවට ලබාදී ඇති ප්‍රකාශය ප්‍රතික්ෂේප කිරීමට ප්‍රමාණවත් කරුණු මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වී නොමැත.

පළමු පැමිණිලිකරු විසින් ඔහුගේ අනන්‍යතාවය තහවුරු කර තිබියදී ද එම පැමිණිලිකරු සම්බන්ධව සාධාරණ සැකයක් තිබේනම් නීත්‍යානුකූලව ඔහුව පරීක්ෂා කිරීමට වගඋත්තරකරුවන්ට කිසිදු බාධාවක් නොමැත. දෙවන වගඋත්තරකරු විසින් මෙම කොමිෂන් සභාවට ප්‍රකාශයක් ලබා දෙමින් සඳහන් කර ඇත්තේ තෙවන වගඋත්තරකරු විසින් මෙම පැමිණිලිකරු පරීක්ෂා කිරීමේදී මෙම පැමිණිලිකරු ප්‍රතිරෝධයක් දැක්වූ බවත් ය. එසේ වුවද තෙවන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත්තේ එම වගඋත්තරකරු විසින් මෙම පැමිණිලිකරුව පරීක්ෂා කිරීමක් සිදු නොකළ බවයි.

තවද සිව්වන වගඋත්තරකරු විසින් 2024.12.11 දින ප්‍රකාශයක් ලබා දෙමින් දන්වා ඇත්තේ තෙවන වගඋත්තරකරු විසින් මෙම පැමිණිලිකරු පරීක්ෂා කිරීමේදී පැමිණිලිකරු සන්තකයේ බීඩි සමග අයිස් කැල්ලක් තෙවන වගඋත්තරකරුට හමුවූ බවයි. එසේ වූවද මෙම වගඋත්තරකරු විසින් 2026.06.18 දින මෙම කොමිෂන් සභා ඉදිරියේ පවසා ඇත්තේ මෙම පළමු පැමිණිලිකරුව පරීක්ෂා කළේ ජීප් රථයට නංවා ගැනීමෙන් පසුව බවයි.

තවද, 2026.06.18 දින පරීක්ෂණයේ දී සිව්වන වගඋත්තරකරුගෙන්, මෙම පළමු පැමිණිලිකරු පරීක්ෂා කළේ ජීප් රථයට නංවා ගැනීමෙන් පසුව නම්, අත්අඩංගුවට ගැනීමට පාදක වූ හේතුව කුමක්ද යනුවෙන් විමසීමේදී, එම වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත්තේ මෙම පළමු පැමිණිලිකරු, දෙවන වගඋත්තරකරුගේ කොලරයෙන් ඇල්ලූ බැවින්, එම හේතුව මත අත්අඩංගුවට ගන්නා ලද බවයි.

එසේ වුවද, දෙවන වගඋත්තරකරු විසින් මෙම කොමිෂන් සභාව ඉදිරියේ දී ඔහුගේ කොළරයෙන් මෙම පළමු පැමිණිලිකරු අල්ලා ගත් බවට කිසිදු අවස්ථාවක ප්‍රකාශ කර නොමැති බවට මෙම කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටී.

ඒ අනුව නියත වශයෙන්ම මෙම පළමු පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට පෙර පරීක්ෂාවට ලක්කර තිබේද, ඔහු සන්තකයේ තිබී අයිස් මත් ද්‍රව්‍ය සොයාගෙන තිබේද යන කරුණු තහවුරු කර ගැනීම සඳහා පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති ප්‍රකාශ හා වීඩියෝ සාක්ෂි වලින් නිරීක්ෂණය වන කරුණු සළකා බලන ලදී.

එහිදී නිරීක්ෂණය වන්නේ, පළමු, දෙවන සහ සිව්වන වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශ අනුව මෙම පළමු පැමිණිලිකරු පරීක්ෂා කර ඇති බවට සඳහන් කර තිබුණද එසේ කිසිදු පරීක්ෂා කිරීමක් සිදු කර නොමැති බව ය. ඒ අනුව මෙම කොමිෂන් සභාව නොමග යැවීමේ චේතනාවෙන් ඔවුන් විසින් සිදු

කරන ලද අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම සැඟවීම සඳහා අසත්‍ය කරුණු ඉදිරිපත් කර ඇති බවට කොමිෂන් සභාව විසින් අවධාරණය කර සිටී.

දෙවන, තෙවන සහ සිව්වන වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශ පරස්පර පරස්පරතාවයක් පවතින බවට කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කිරීමෙන් ද, ම පළමු පැමිණිලිකරු කඩය අසලදී අත්අඩංගුවට ගන්නා ලද හේතුව නිසි ලෙස මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමට වගඋත්තරකරුවන් අපොහොසත් වී ඇති බවට පැහැදිලි වීම තුලින්ද, මෙම පළමු පැමිණිලිකරුව එම අවස්ථාවේදී අත්අඩංගුවට ගෙන තිබීම අත්තනෝමතික අත්අඩංගුවට ගැනීමක් බවට කොමිෂන් සභාව නිරීක්ෂණය කර සිටී.

එහෙයින් මෙම පැමිණිලිකරු ජීප් රථයට නංවා ගැනීමට පෙර අත්අඩංගුවට ගැනීමට අදාළ නිසි හේතුවක් මෙම පළමු පැමිණිලිකරු වෙත දැනුම් දී නොමැති බවට කරුණු අනාවරණය වන අතර, ප්‍රධාන පාරේ පිහිටා තිබෙන තවත් පුද්ගලයින් සිටින කෑම කඩයක් වෙත ගිය මෙම පැමිණිලිකරු සම්බන්ධව සැකයක් මතුවීමට තරම් තිබුණු සාධාරණ හේතුවක් වගඋත්තරකාර පාර්ශවය විසින් ඉදිරිපත් කර නොමැත.

රාත්‍රී කාලයේ පුද්ගලයින් නොමැති ස්ථානයක හෝ පාරක හෝ පුද්ගලික පාරක වැනි ස්ථානවල යම්කිසි පුද්ගලයෙකු තනියෙන්ම ගමන් කිරීමක් නිරීක්ෂණය වන්නේ නම් එම පුද්ගලයා පිළිබඳව යම්කිසි සැකයක් මතුවීමට අවස්ථාවක් තිබෙන නමුත්, ප්‍රධාන පාරක පුද්ගලයින් ගැවසෙන කෑම කඩයක් වෙත පැමිණෙන බැලූ බැල්මට සැක සිතීමට තරම් හේතුවක් නොමැති පුද්ගලයෙකු අනන්‍යතාවය තහවුරු කර තිබියදී නිසි පරීක්ෂණයකින් තොරව අත්අඩංගුවට ගැනීම අත්තනෝමතික අත්අඩංගුවට ගැනීමක් බවට මෙම කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටී.

මෙහිදී, පළමු පැමිණිලිකරු විසින් අධිකරණයේ දී වරද පිලිගෙන ඇති බවට කරුණු ඉදිරිපත් කර තිබුණද මෙම කොමිෂන් සභාව විසින් සළකා බලනු ලබන්නේ මෙම පළමු පැමිණිලිකරු පළමුවෙන්ම අත්අඩංගුවට ගෙන ඇත්තේ පැමිණිල්ලේ සඳහන් පරිදි නයිට් කඩය අසල වන බැවින් එම අවස්ථාවේදී අත්අඩංගුවට ගැනීමට ප්‍රමාණවත් සාධක තිබුණාද යන්න වේ.

මෙහිදි මෙම පළමු පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති වීඩියෝ සාක්ෂි සහ පාර්ශවකරුවන්ගේ ප්‍රකාශයන් අනුව කිසිදු අවස්ථාවක මෙම පළමු පැමිණිලිකරු එම කඩය අසල අත්අඩංගුවට ගැනීමේදී ප්‍රමාණවත් සාධක තිබුණු බවට කරුණු අනාවරණය නොවන අතර, වගඋත්තරකරුවන් විසින් ඒ සඳහා ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කර නොමැති බවද මෙම කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටී.

එම නිරීක්ෂණ අනුව මුල් අවස්ථාවේදී සාධාරණ හේතුවක් නොමැතිව අත්අඩංගුවට ගෙන ඇති මෙම පැමිණිලිකරු වෙත අත්අඩංගුවට ගැනීමට අදාළ හේතුවක් දැනුම් දීමේ හැකියාවක් නොපවතින බැවින්, මෙම පැමිණිලිකරු වෙත ඔහුව අත්අඩංගුවට ගනු ලබන්නේ කුමන හේතුව මත ද යන්න

දන්වා නොමැති බවට කොමිෂන් සභාවේ නිගමනය වේ. මෙම පළමු පැමිණිලිකරු විසින් අධිකරණයේ වරද පිළිගෙන ඇති බැවින්, ඔහුව නිවසට රැගෙන යන අවස්ථාවේ දී ඔහු සන්තකයේ හෝ නිවසට යාමෙන් පසුව නිවසේ දී හෝ නීත්‍යානුකූල නොවන දෙයක් වගඋත්තරකරුවන් විසින් සොයාගෙන තිබේ ද නැද්ද සම්බන්ධව මෙම කොමිෂන් සභාවට නිගමනයකට එළඹිය නොහැක.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදයේ 13(1) වන ව්‍යවස්ථාව පහත පරිදි වේ.

> " නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු සිරභාරයට ගැනීම නොකළ යුත්තේ ය. යම් තැනැත්තෙකු සිර භාරයට ගනු ලබන්නේ නම් හේතුවක් මතද ඒ හේතුව ඒ තැනැත්තාට දැන්විය යුත්තේ ය. "

ඉහත කී 13(1) ව්‍යවස්ථාවට අනුව අත්අඩංගුවට ගැනීමක් සිදු කළ යුත්තේ නීතියෙන් නියම කර ඇති ක්‍රියා පටිපාටියට අනුකූලව පමණක් බවත්, එසේ අත්අඩංගුවට ගැනීම සඳහා නිසි හේතුවක් තිබිය යුතු අතර අත්අඩංගුවට ගැනීමට පෙර අත්අඩංගුවට ගන්නා හේතුව දැන ගැනීමේ අයිතිය එම පුද්ගලයාට පවතින බවට මෙම ව්‍යවස්ථාව මගින් තහවුරු කර සිටී.

ඒ අනුව මෙම පළමු පැමිණිලිකරු විසින් ඔහුගේ අනන්‍යතාවය තහවුරු කර තිබියදී උක්ත දෙවන, තෙවන සහ සිව්වන වගඋත්තරකරුවන් විසින් මෙම පැමිණිලිකරුට අදාළව මතුවූ සාධාරණ සැකය කුමක්ද යන කාරණාව ඔප්පු කර නොමැති වීම හේතුවෙන් පැමිණිලිකරු වෙත හේතුවක් නොදන්වා පදනම් විරහිත ලෙස අත්තනෝමතිකව අත්අඩංගුවට ගැනීම තුළින් මෙම පැමිණිලිකරුගේ 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) ව්‍යවස්ථාව යටතේ තහවුරු කර ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති බවට කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටී.

1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව පහත පරිදි වේ.

> *" නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතිය රැකවරණයද සර්ව සාධාරණ විය යුත්තේ ය."*

තවද *Ariyawansa and Others v. The People's Bank and Others (2006) 2 Sri LR 145* යන නඩු තීන්දුවේ

> *"………any action or law which is arbitrary or unreasonable violates equality."*

යනුවෙන් දක්වා තිබීම තුළින් අත්තනෝමතික හෝ අසාධාරණ ක්‍රියාවලියන් සමානාත්මතාවය උල්ලංඝණය කිරීමක් බවට නිගමනය කළ හැකි ය. එහෙයින් වගඋත්තරකාර පාර්ශවකරුවන් විසින් සිදු කර ඇති අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම තුළින් පැමිණිලිකරුගේ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති අයිතිවාසිකම් ද උල්ලංඝණය වී ඇති බවට මෙම කොමිෂන් සභාව විසින් තවදුරටත් නිරීක්ෂණය කර සිටී.

උක්ත පළමු පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති ඉහත පැමිණිල්ලේ සඳහන් අනෙකුත් කාරණාව වන්නේ මෙම පැමිණිලිකරු දෙවන, තෙවන, සිව්වන වගඋත්තරකාර පාර්ශවයන් විසින් අත්අඩංගුවට ගැනීමේදී මෙම පළමු පැමිණිලිකරුට අමානුෂික ලෙස වදහිංසා කළ බවයි.

පළමු පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කර ඇති වීඩියෝ සාක්ෂි නිරීක්ෂණය කිරීමේදී, පැමිණිලිකරු ඉහත සඳහන් කෑම කඩයට ඇතුළුවන විට එක් නිලධාරියෙකු විසින් පැමිණිලිකරුව ටී-ෂර්ට් එකෙන් අදින්න උත්සාහ කරන බවටත්, පසුව මෙම පැමිණිලිකරු කඩය ඇතුළට පැමිණීමෙන් පසුව එක් නිලධාරියෙකු පළවන පැමිණිලිකරුගේ බෙල්ලෙන් ද තවත් නිලධාරියෙකු පැමිණිලිකරුගේ අතින් අල්ලා අදින බවටත් නිරීක්ෂණය වේ.

පසුව පළවන පැමිණිලිකරුගේ අත් දෙක මාංචු දමාගෙන කඩෙන් පිටව යනවිට මෙම පැමිණිලිකරුව පිටුපසින් තල්ලු කරන බවටත්, මෙම පැමිණිලිකරුගේ බෙල්ලෙන් අල්ලාගෙන සිටි නිලධාරියා විසින් පැමිණිලිකරුගේ පිටුපසට පහරක් ගසන බවත් පැමිණිලිකරු ජීප් රථය අසලට රැගෙන විත් නිලධාරීන් තිදෙනා විසින්ම අතින් පයින් පැමිණිලිකරුට පහර දෙන බවත්, එයින් එක් නිලධාරියෙකු පැමිණිලිකරුගේ කකුල් දෙක ඔසවා ජීප් රථය තුළට තල්ලු කරන බවත්, අදාළ වීඩියෝ සාක්ෂි මගින් නිරීක්ෂණය වේ.

මෙම වීඩියෝ සාක්ෂි වලට අමතරව පැමිණිලිකරු විසින් මෙම කොමිෂන් සභාව වෙත දන්වා ඇත්තේ, ජීප් රථයට නැගුනු වෙලාවේ සිට ජීප් රථයේ බිම වාඩිවීමට කියා පැමිණිලිකරුගේ කම්මුල්වලට, හිසට ජීප් රථයේ පිටුපස අසුනේ සිටි දෙදෙනා විසින් ද, ඉදිරිපස අසුනේ සිටි දෙදෙනාද පිටුපස හැරී හැරී පහර දුන් බවත්, තවද 'උඹව කැස්බෑව පොලීසියට නෙවෙයි ගෙනියන්නේ උඹව මරන්න ගෙනියන්නේ' කියා තර්ජනය කළ බවත් වැඩිදුරටත් දන්වා ඇත.

තවද, එසේ පවසමින් පිට්ටනියක් වැනි ස්ථානයකට රැගෙන ගොස් මාංචු ගලවා අත් දෙක පිටුපසට කර නැවත මාංචු දමා පිට්ටනියේ බිමට බස්සවා තුවක්කුව ඔලුවට දික් කර තර්ජනය කර දණගස්වා ජීප් රථයේ තිබූ හෝස් බටයකින් සහ තුවක්කුවෙන් පහර දුන් බවත් ඇස්වලට ටෝච් එක අල්ලා සිටි බවත් 'උඹ අරගලකාරයෙක්ද? කැම්පස්කාරයෙක්ද? කුඩුකාරයෝ උඹලා තමයි' ලෙස පවසා පරුෂ වචන වලින් බැණ වැදුනු බවත් මුහුණ බිමට සිටින ලෙස දිගා කර පිට පැත්තට පහර දුන් බවත් වැඩිදුරටත් දන්වා ඇත.

මෙම කෲර අමානුෂික සැලකිල්ල හා වධහිංසා කළ බවට පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති කරුණු පිළිබඳව මෙම කොමිෂන් සභාවේ අවධානය යොමු කර සිටී.

මේ පිළිබඳව වගඋත්තකරුවන්ගෙන් විමසීමේදී පළමු වගඋත්තරකරු වෙනුවෙන් මෙම කොමිෂන් සභාව වෙත ප්‍රකාශ කර ඇත්තේ, පළමු පැමිණිලිකරු පලා යාමට උත්සාහ කිරීමේදී දෙවන, තෙවන සහ සිව්වන වගඋත්තරකරුවන් මෙම පැමිණිලිකරු පාලනය කිරීමට උත්සාහ කිරීමේදී මෙම පැමිණිලිකරු දුවගෙන යන අවස්ථාවේදී කොන්ක්‍රීට් කණුවක ගැටී වැදුනු බවය.

එහෙත් දෙවන, තෙවන සහ සිව්වන වගඋත්තරකරුවන් විසින් දන්වා ඇත්තේ පහරදීමක් සිදු නොවූ බවත්, අත්අඩංගුවට ගැනීමේදී පොර බැදීමක් සිදුවූ බවටත් පමණක් ප්‍රකාශ කර ඇත. පැමිණිලිකරු දුවගෙන යන අවස්ථාවේදී කොන්ක්‍රීට් කණුවක ගැටී වැදුනු බවට කිසිදු අවස්ථාවක සඳහන් කර නොමැත. තවද, සිව්වන වගඋත්තරකරු විසින් මෙම කොමිෂන් සභාව ඉදිරියේ දී ලබා දී ඇති ප්‍රකාශයේ වැඩිදුරටත් දන්වා ඇත්තේ, මෙම පැමිණිලිකරු පළා යාමට උත්සාහ නොකළ බවයි.

වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුට මෙහිදී පහරදීමක් සිදු නොවූ බවට ඉදිරිපත් කර ඇති ප්‍රකාශය පිළිගත නොහැකි අතර පළමු වගඋත්තරකරු වෙනුවෙන් ලබා දී ඇති ප්‍රකාශය සහ සිව්වන වගඋත්තරකරු විසින් ලබා දී ඇති ප්‍රකාශ අතර පරස්පරතාවයක් පවතින අතර, පළමු පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති වීඩියෝ සාක්ෂි අනුව එසේ පලා යාමට උත්සාහ දැරීමක් නිරීක්ෂණය නොවන අතර පැමිණිලිකරුට දෙවන, තෙවන සහ සිව්වන වගඋත්තරකරුවන් විසින් පහර දෙන ආකාරය ඉතා පැහැදිලිව නිරීක්ෂණය වේ.

මෙම පළමු පැමිණිලිකරු පලා යාමට උත්සාහ කළේ නම් එම ස්ථානයෙන් පිටත්වීමට ඔහු කටයුතු කළ යුතු ය. එහෙත් පළමු පැමිණිලිකරු ජීප් රථය අසල සිට එම ස්ථානයේම පිහිටා තිබෙන කෑම කඩයට ඇතුළු වන බවට නිරීක්ෂණය වේ. එමගින් පළමු පැමිණිලිකරු පලා යාමට උත්සාහයක් දරා නොමැති බවට පැහැදිලි වන බැවින් පැමිණිලිකරු පලා යාමට උත්සාහ කළ බවත්, ඒ අනුව නිලධාරීන් මෙම පළමු පැමිණිලිකරුගේ පසුපස පන්නාගෙන යන අවස්ථාවේ පැමිණිලිකරු කොන්ක්‍රීට් කනුවක ගැටී වැටුනු බවටත් පළමුවන වගඋත්තරකරු වෙනුවෙන් ඉදිරිපත් කර ඇති ප්‍රකාශය අසත්‍ය බව පෙනී යන බැවින් එම කරුණු මෙම කොමිෂන් සභාව විසින් පිළිගැනීමක් සිදු නොකරයි.

මෙම සිදුවීම සිදුවී ඇත්තේ 2023.10.17 දින පාන්දර 2.00-4.00 අතර වන බවට ඉදිරිපත් කර ඇති වීඩියෝ සාක්ෂි අනුව නිරීක්ෂණය වන අතර, එදින මෙම පැමිණිලිකරු අධිකරණයට ඉදිරිපත් කර ඇති බවට වගඋත්තරකරු විසින් ඉදිරිපත් කර ඇති බී වාර්තාව අනුව නිරීක්ෂණය වේ.

එසේ අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසුව මෙම පැමිණිලිකරු විසින් එදිනම කළුබෝවිල රෝහලට ප්‍රතිකාර ලබා ගැනීම සඳහා ඇතුළත් වී ඇති බවට එම රෝහලේ අධිකරණ වෛද්‍යවරයා විසින් ඉදිරිපත් කර ඇති අධිකරණ වෛද්‍ය වාර්තා අනුව පැහැදිලි වේ.

එකී අධිකරණ වෛද්‍ය වාර්තාවේ මෙම පැමිණිලිකරු විසින් අධිකරණ වෛද්‍යවරයා වෙත ලබා දී ඇති ප්‍රකාශය වන්නේ ;

> '........ මම බෑ කියලා කඩේ ඇතුළට ගියා. ඒ ගොල්ලෝ හතර දෙනා මගේ අත් කකුල් වලින් උස්සගෙන ගිහිල්ලා ජීප් එකේ පිටිපස්සට දැම්මා. ජීප් එකට දා ගන්න කලින් අත් ඉස්සරහට දාලා මාංචු දැම්මා කඩේ ඇතුලෙදී. ජීප් එකේ යන ගමන් අත් පිටිපස්සට කරලා මාංචු දැම්මා. වාහනේ යන ගමන් අතින් පයින් ඇගට ගැහුවා. කොණ්ඩෙන් ඇද්දා. මාව ජීප් එකෙන් කැස්බෑව පොලීසිය පහුකරගෙන (මට පෙන්නුවා කැස්බෑව පොලීසිය පහුවෙන කොට) ඒ ලග

> පාලු පිට්ටනියකට අරගෙන ගියා. ජීප් එක පිට්ටනිය මැද නවත්තලා මාව බැස්සුවා. Uniform හිටිය පොලිසියේ එක්කෙනෙක් T-56 එකක් මගේ ඔලුවට තිබ්බා. මට දණ ගහපන්, බිම දිගාවෙයන් කියලා මට එක එක ඉරියව්වෙන් ඉන්න කියලා කිව්වා. මාව මරණව කියලා කිව්වා. Ground එකේදී අතින් පයින් ගහන්න ගත්තා. කම්මුලට, ඔලුවට, පිටට ගැහුවා. මුණින් අතට දිගා කරලා බිම හාංසි කරලා පයින් පිටට හොදටම ගැහුවා. හෝස් බටේකින් ඇගේ පිටිපස්සට හොදටම ගැහුවා. ගනන් කර ගන්න බැරි තරමට . Ground එකේදී විනාඩි 10-15 ක් ගැහුවා. (අත් පිටිපස්සට කරලා මාංචු දාලා තිබ්බේ.) අල්විස් කියන officer phone එකේ flash එක ගහගෙන හිටියා. T-56 තුවක්කු මිටෙන් ඇන්නා. මට ගහන ගමන් කිව්වා මට කැස්බෑව ගමෙන් යන්න කියලා. තුවක්කුව load කරන ගමන් මාව මරණව කියලා කිව්වා කඩේ CCTV තිබුණේ නැත්නම්.........'

මෙහිදී පළමු පැමිණිලිකරුගේ හිසට සහ මුහුණට පහර දුන් බවට දන්වා ඇති අතර අධිකරණ වෛද්‍ය වාර්තාවේ පැමිණිලිකරුගේ හිස සහ මුහුණ යන ප්‍රදේශ වල අධිකරණ වෛද්‍යවරයා විසින් නිරීක්ෂණය කර ඇත්තේ,

*Head and Face:*

1. *A periorbital contusion bluish black in color measuring 4 cm x 3cm was situated on the lower aspect of the left eye. No associated sub conjunctival hemorrhages were present.*
2. *A group of discrete small contusions, red in color with their sizes varying from 1cm x 0.5cm to 1 cm x 3 cm was dispersed in an area measuring 11cm x 7cm on the left side of the face.*
3. *A contusion, red in color measuring 2cm x 0.5cm was situated on the back aspect of the left ear lobe.*
4. *A contusion, bluish red in color measuring 1cm x 1cm was situated on the back side of the head overlying the left mastoid process.*
5. *A group of small contusions, red in color with their sizes varying from 1cm x 1cm to 1cm x 205cm was dispersed in an area measuring 11cm x 15cm on the right side of the face.*
6. *A contusion, bluish red in color was situated on the back aspect of the right ear lobe.*
7. *A contusion, bluish red in color measuring 1cm x 0.5cm was situated on the back of the head overlying the right mastoid process.*

*Neck:*

1. *A group of discrete small contusions, red in color with their sizes varying from 1cm x 0.5cm to 1cm x 3 cm was dispersed in an area measuring 10cm x7cm*

තවද පැමිණිලිකරුගේ අතට මාංචු දමා වාහනයේ යන ගමන් සහ පිට්ටනියේදී අතින් පයින් සහ හෝස් බටයකින් මුළු ඇඟටම පහර දුන් බවට දන්වා ඇති අතර ඊට අදාළව අධිකරණ වෛද්‍යවරයා විසින් නිරීක්ෂණය කර ඇත්තේ ;

*Upper limbs*

1. *09. A group of concrete contusions, red in color with their sizes varying from 0.5 cm x 0.5 cm to 1 cm x 0.5 cm was situated on the back aspect of the right arm.*
2. *An overlapping two patterned contusions, bluish red in color dispersed in an area of 11 cm x 8 cm were situated on the back aspect of the mind third of the left arm.*
3. *A linear abrasion with wet scab was present on the back aspect of the upper third of the right forearm.*
4. *A linear abrasion measuring 3.5 cm in length was situated on the inner aspect of the right wrist. Associated swelling with redness was present around the wrist.*
5. *A conclusion, red in color measuring 3 cm x 2 cm was situated on the outer aspect of the right wrist. Associated swelling with redness was present around the wrist.*

තවද, මෙම පැමිණිලිකරු අදුරු පිට්ටනියකදී මුනින් අතර දිගා කරලා පයින් පිටට හොදටම පහර දුන් බවට දන්වා ඇති අතර ඊට අදාළව අධිකරණ වෛද්‍යවරයා විසින් නිරීක්ෂණය කර ඇත්තේ ;

*Chest*

1. *14. An irregular contusion bluish – red in color measuring 7 cm x 3 cm was situated on the back aspect of the left shoulder.*
2. *15. An irregular contusion bluish in color measuring 5 cm x 2.5 cm was situated on the back aspect of the right – side upper chest.*
3. *16. An irregular diffuse contusion bluish purple in color measuring 20 cm x 12 cm was situated on the back aspect of the lower right – side chest.*

*Abdomen – No injuries were present.*

*Back and buttocks*

1. *17. A group of overlapping contusions, bluish red in color dispersed in an area measuring 24 cm x 15 cm was situated on the left side of the buttocks and outer aspect of the upper third of the left thigh.*

*Lower limbs*

1. *19. A group of overlapping contusions, bluish red in color dispersed in an area measurement 2 cm x 15 cm situated on the inner and back aspects of the lower two thirds of the right third.*
2. *20. A contusion measuring 4 cm x 3 cm was situated on the back aspect of the lower third of the right thigh. an abrasion with wet scab measuring 2 cm x 2 cm was situated on the skin overlaying the contusion.*
3. *21. An abrasion with wet scab measuring 3 cm x 2 cm was situated on the front aspect of the right knee.*
4. *22. A contusion, bluish red in color measuring 5 cm x 3 cm was situated on the outer aspect of the upper third of the left leg.*

*Investigations*

1. *FAST (focus assessment with sonography for trauma) done at the admission was negative.*
2. *X-ray No. 76989 of skull, cervical spine, chest, lumbo – sacral spine, pelvis, right and left knee joints and right and left wrists – No fractures were present.*
3. *Creatinine kinase (CK) levels – 1037.1 U/L (normal expected values < 171.0 U/L)* යනුවෙන් වේ.

මෙහිදී පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති වධහිංසාවට අදාළ පැමිණිල්ලේ සඳහන් කර ඇති කරුණු පැමිණිලිකරු විසින් ඔහු රෝහල් ගතව ප්‍රතිකාර ලබා ගැනීමට පෙර අධිකරණ වෛද්‍යවරයා වෙත ද ඒ ආකාරයෙන්ම ඉදිරිපත් කර ඇති අතර, අධිකරණ වෛද්‍යවරයාගේ නිරීක්ෂණයන් අනුව පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද සිදුවීම එකී නිරීක්ෂණය හා සැසඳෙන බව අධිකරණ වෛද්‍යවරයා විසින් එකී වාර්තාවේ පැහැදිලි ලෙස සඳහන් කර ඇත. අධිකරණ වෛද්‍යවරයාගේ මතය පහත පරිදි වේ.

1. *All the injuries are compatible with that caused by blunt force trauma*
2. *All the injuries are non-grievous in nature according to Penal Code of Sri Lanka when taken individually or collectively*

3. *All the injuries are at the same stage of healing and it is compatible with the dating of the alleged incident*
4. *The injury numbers 10, 17, 18 and 19 are compatible with that caused by repeated assaults with blunt, elongated weapon/s with smooth surface*
5. *Injury numbers 12 and 13 are compatible with restrained injuries and could have been caused as result of application of handcuff as alleged by the examinee*
6. *The injury pattern is highly suggestive of non-accidental nature*
7. *The elevated levels of creatinine kinase (is an enzyme present in muscles and released in response to muscle injury) is indicative of significant muscle injury associated with the alleged assault*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව පහත පරිදි වේ.

> " කිසිම තැනැත්තෙකු වධහිංසා වලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේ ය. "

මෙම ව්‍යවස්ථාව මගින් සියළුම පුද්ගලයින් වධහිංසාවලින්, කෲර අවමන් සහගත සැලකිල්ලට ලක් නොවීමට ඇති අයිතිය තහවුරු කර ඇත.

තවද, *International Convention on Civil and Political Rights හි 7 වන වගන්තියේ පහත පරිදි දක්වා ඇත;*

> *"No one shall be subjected to torture or degrading treatment or punishment. In particular, no one shall be subjected without his free consent to medical or scientific experimentation."*

වධහිංසාව පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය වන *The Convention Against Torture and Other Cruel, Inhuman or Degrading Treatment or Punishment* හි 1 වන ව්‍යවස්ථාවේ සඳහන් වන්නේ

> *For the purposes of this Convention, the term "torture" means any act by which severe pain or suffering, whether physical or mental, is intentionally inflicted on a person for such purposes as obtaining from him or a third person information or a confession, punishing him for an act he or a third person has committed or is suspected of having committed, or intimidating or coercing him or a third person, or for any reason based on discrimination of any kind, when such pain or suffering is inflicted by or at the instigation of or with the consent or acquiescence of a public*

*official or other person acting in an official capacity. It does not include pain or suffering arising only from, inherent in or incidental to lawful sanctions* යනුවෙන් වේ.

ඉහත කී සම්මුතියට අනුව ශ්‍රී ලංකාවේ පවතින 1994 අංක 22 දරණ වධදීමට සහ අනෙකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැලකීමට හෝ දඬුවම් වලට එරෙහි වූ සම්මුතිය පනතේ 12 වන වගන්තිය යටතේ වධදීම යන්න අර්ථ නිරූපනය කර ඇත;

" වධදීම යන්නෙහි ව්‍යාකරණානුකූල වෙනස්වීම් සහ සජාතීය යෙදුම් ඇතුළුව වධදීම යන්නෙන් වෙනත් යම් තැනැත්තෙකුට දැඩි ශාරීරික හෝ මානසික වේදනා ගෙන දෙන්නා වූද

(අ) පහත දැක්වෙන කාර්යයන් සඳහා එනම්

i. එකී වෙනත් තැනැත්තාගෙන් හෝ තුන්වන තැනැත්තෙකුගෙන් යම් තොරතුරක් හෝ පාපොච්චාරනයක් ලබා ගැනීම හෝ

ii. එකී වෙනත් තැනැත්තා හෝ තුන්වන තැනැත්තෙකු විසින් කරන ලද හෝ කරන ලදැයි සැක කෙරෙන යම් ක්‍රියාවක් සඳහා ඒ තැනැත්තාට දඬුවම් කිරීම සඳහා වූද,

iii. එකී වෙනත් තැනැත්තා හෝ තුන්වන තැනැත්තෙකු බිය ගැන්වීම හෝ ඔහුට බල කිරීම සඳහා

(ආ) වෙනස්කම් කිරීම මත පදනම් වූ වෙනත් හේතුවක් නිසා කරන්නා වූද,

සෑම අවස්ථාවකදීම රජයේ නිලධරයෙකු හෝ නිල තත්වයකින් කටයුතු කරන වෙනත් තැනැත්තෙකු විසින් හෝ එම නිලධරයාගේ හෝ තැනැත්තාගේ මුල්වීමෙන් හෝ කැමැත්ත ඇතිව හෝ එම නිලධරයාගේ හෝ තැනැත්තාගේ විරුද්ධ නොවීම මත කරන්නා වූද යම් ක්‍රියාවක් අදහස් වේ."

තවද ***Sudath Silva V. Kodituakku, Inspector of Police and Others (1987) 2 SLR 119*** යන නඩු තීන්දුවේ පහත පරිදි සඳහන් කර ඇත.

*"It prohibits every person from inflicting torturesome, cruel or inhuman treatment on another. It is an absolute fundamental right subject to no restrictions or limitations whatsoever. (.....) The police force, being an organ of the state, is enjoined by the Constitution to secure and advance this right and not to deny, abridge or restrict the same in any manner and under any circumstances...."*

මෙහිදී ඉහත සඳහන් 11 වන ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති අයිතිය නිරපේක්ෂ අයිතියක් බවත් කිසිදු ආකාරයකින් සීමා කිරීමට හෝ නියමයන්ට යටත් කිරීමට හෝ නොහැකි අයිතිවාසිකමක් බවට උක්ත නඩු තීන්දුවේ සඳහන් කර ඇත.

***Bandula Samarasekara V. Vijitha Alwis O.I.C Ginigathhena Police Station SC and Others (2009) 1 SLR 213***

> *"It is a duty of police officer to use his best endeavor and ability to prevent all crimes, offences and public nuisance and more importantly to preserve the peace. In order to carry out his duties efficiently and effectively, it would be necessary to have the trust and respect of the public. It is not easy to command that from the public and in order to earn such trust and respect, the police officers must possess a higher standard of moral and ethical values than that is expected from an average person."*

ඉහත නඩු තීන්දුව මගින් පොලිස් නිලධාරියෙකු ඔහුගේ රාජකාරිය කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ඉටු කිරීමට නම් මහජනතාවගේ විශ්වාසය සහ ගෞරවය ලබා ගතයුතු බවත් මහජනතාවගෙන් එවැනි විශ්වාසයක් හා ගෞරවයක් ලබා ගැනීමට නම් සාමාන්‍ය පුද්ගලයෙකුගෙන් බලාපොරොත්තු වනවාට වඩා උසස් සදාචාරාත්මක හා සංස්කෘතික වටිනාකමක් පොලිස් නිලධාරියෙකු සතු වියයුතු බවට දක්වා ඇත.

***Janaka Sampath Batawalage v. Inspector Prasanna Rathnayake SC FR 393/2018***

> *"…..when dealing with the public, the police officers have a bounded duty to act with caution and restrain to ensure that they do nothing in derogation of the fundamental rights granted to all citizens under the Constitution."*

ඉහත නඩු තීන්දුව මගින් දක්වා ඇත්තේ පොලිස් නිලධාරීන් මහජනතාව සමග කටයුතු කිරීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පුරවැසියන්ට තහවුරු කර ඇති මූලික අයිතිවාසිකම් වලට හානියක් සිදු නොවූ බවට වගබලා ගතයුතු බවට වගකීමක් පොලිස් නිලධාරීන් සතුව පවතින බවයි.

මෙහිදී පළමු පැමිණිලිකරු විසින් පැමිණිල්ලේ සදහන් පරිදි මෙම පැමිණිලිකරුට දෙවන, තෙවන සහ සිවුවන වගඋත්තරකරුවන් විසින් අමානුෂික ලෙස පහරදී වදහිංසාවට ලක්කර ඇති බවට ඉදිරිපත් කර ඇති චෝදනාව සම්බන්ධව සළකා බැලීමේදී මෙම පැමිණිලිකරු ජීප් රථයට නංවා ගැනීමට පෙර දෙවන, තෙවන සහ සිව්වන වගඋත්තරකරුවන් තිදෙනා විසින් සිදු කර ඇති පහරදීම පළමු පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති වීඩියෝ සාක්ෂි වලින් පැමිණිල්ලේ සදහන් ආකාරයටම එම අවස්ථාවේදී මෙම පැමිණිලිකරුට පහරදී ඇති බවට කරුණු තහවුරු වේ. පැමිණිලිකරු විසින් සදහන් කර ඇති පරිදි පිට්ටනියකට රැගෙන ගොස් සිදු කර ඇති වදහිංසා පිළිබඳව අධිකරණ වෛද්‍ය වාර්තාව මගින් පැහැදිලිව තහවුරු වේ.

එහෙයින් මෙම සාක්ෂි අනුව මෙම පැමිණිලිකරු විසින් සදහන් කර ඇති පරිදි මෙම පළමු පැමිණිලිකරු අමානුෂික හා කෲර ලෙස වදහිංසාවට ලක් කර ඇති බවට මෙම කොමිෂන් සභාව නිගමනය කර සිටින අතර එමගින් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාවේ සදහන් මූලික අයිතිවාසිකම් උක්ත වගඋත්තරකරුවන් තිදෙනා විසින් උල්ලංඝණය කර ඇති බවට කොමිෂන් සභාව නිගමනය කර සිටී.

තවද මෙම පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති CCTV වීඩියෝ සාක්ෂි අනුව පැමිණිලිකරුගේ තාවකාලික පදිංචිය ස්ථානය වෙත ළගා වී ඇත්තේ පාන්දර 3.20 ට පමණ වන අතර එම අවස්ථාවේ දී ජීප් රථයේ පිටුපස දොර අරිමින් එක් වගඋත්තරකාර පාර්ශවකරුවෙකු එළියට බැසීමෙන් පසුව පැමිණිලිකරු ජීප් රථය තුළ බිම වාඩිකර තිබෙන බවට නිරීක්ෂණය කළ හැක.

මෙහිදි මෙම පළමු පැමිණිලිකරුට දෙවන, තෙවන සහ සිව්වන වගඋත්තරකරුවන් විසින් පහර දී වධහිංසාවට ලක්කර ඇති අතර, ඔවුන් එදින ගමන් කළ ජීප් රථයේ පිටුපස අසුන්ගෙන යාමට අසුනක් තිබිය දී මෙම පළමු පැමිණිලිකරු බිම ඉඳවා ගෙන රැගෙන ගොස් තිබීම යන කාරණාව මෙම කොමිෂන් සභාව නිරීක්ෂණය වන්නේ, එමගින් මෙම පැමිණිලිකරු අවමන් සහගත සැළකිල්ලට ද භාජනය කර ඇති බවට ය.

<u>දෙවන පැමිණිලිකාරිය අත්අඩංගුවට ගැනීම සහ රඳවා තබාගැනීමේ නීත්‍යානුකූලභාවය:</u>

කොමිෂන් සභාව විසින් මෙම පැමිණිල්ලේ දෙවන පැමිණිලිකාරියගේ අත්අඩංගුවට ගැනීම පිළිබඳව කරුණු සළකා බලන ලදී. උක්ත දෙවන පැමිණිලිකාරිය පළමු පැමිණිලිකරුගේ නිවසේ සිටි බවට පළමු පැමිණිලිකරු සහ වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශ අනුව තහවුරු වන අතර එම පැමිණිලිකාරියගේ සන්තකයේ තිබී නීතිවිරෝධී මත්ද්‍රව්‍යයක් හෝ වෙනත් යම් නීතිවිරෝධී දෙයක් සොයා ගත් බවට උක්ත වගඋත්තරකරුවන් විසින් කරුණු ඉදිරිපත් කර නොමැත.

එසේ වුවද, දෙවන පැමිණිලිකාරිය ද පොලිස් ස්ථානය වෙත රැගෙන යාමක් සිදු වී ඇති අතර එසේ රැගෙන යාම වගඋත්තරකකරුවන් විසින් සාධාරණීකරණය කර ඇත්තේ එම ස්ථානයේ එනම් පැමිණිලිකරුගේ නිවසේ අනාරක්ෂිත බව සිතා සහ එම ස්ථානයේ තවත් කිසියම් මත්ද්‍රව්‍ය තිබී සැඟවීමට උත්සාහ දරයි යන සැකය මත බවයි.

වගඋත්තරකාර පාර්ශවය විසින් මෙම කොමිෂන් සභාව වෙත ගොනු කර ඇති උද්ධෘත වාර්තාව අනුව වගඋත්තරකරුවන්ගේ පැමිණීමේ වේලාව පැය 0615 බවට සඳහන් වන අතර (පිටුව 296/ඡේද 346) මෙම දෙවන පැමිණිලිකාරිය වූ රෂා හසිනා යන අය කා.පො.කො. 13067 ධනුෂිකා ලවා පරීක්ෂා කළ අතර නඩුබඩු නොමැති බවත් ඇයගෙන් ප්‍රශ්න කිරීමේදී හරස් පිළිතුරු ලබා දුන් බවත් ඇය එම ස්ථානයේ රැඳී සිටින්නේ යම් වරදක් හෝ අපරාධයක් කිරීමට යැයි සැක සිතී එම අනන්‍යතාවය තහවුරු නොවීමේ වරද කියා දී අත්අඩංගුවට ගත් බව සටහන් කර ඇත.

ඉහත කරුණු අනුව නිරීක්ෂණය වන්නේ, එම නිවසේ තවත් කිසියම් මත්ද්‍රව්‍ය තිබේද යන්න වගඋත්තරකරුවන් තිදෙනාට නිවස පරීක්ෂා කිරීමට කිබුණු අවස්ථාව මගහැර මෙම දෙවන පැමිණිලිකාරිය නිකරුණේ අත්අඩංගුවට ගෙන ඇති අතර, එකී අත්අඩංගුවට ගැනීම සාධාරණීකරණය කිරීම සඳහා විවිධ හේතු ඉදිරිපත් කර ඇති බව ය.

කරුණු එසේ හෙයින්, මෙම දෙවන පැමිණිලිකාරිය අත්අඩංගුවට ගැන ඇත්තේ කිසිදු හේතුවක් නොමැතිව සහ ඇයට ඉහත සඳහන් පරිදි 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 13(1) ව්‍යවස්ථාව යටතේ නිසි හේතුවක් නොදන්වා බවටත් ඉහත කරුණු අනුව පැහැදිලි වේ. මෙම අත්අඩංගුවට ගැනීමද නීත්‍යානුකූල නොවන පරිදි අත්තනෝමතික ලෙස සිදු කර ඇති බවට කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය වේ.

තවද, මෙම පැමිණිලිකාරිය සම්බන්ධව පළමු, දෙවන, තෙවන සහ සිව්වන වගඋත්තරකරුවන් විසින් ලබාදී ඇති ප්‍රකාශය වන්නේ දෙවන පැමිණිලිකාරිය නිවසේදී කා.පො.කො. 13067 ධනුෂිකා නිලධාරිණිය ලවා පරීක්ෂා කළ බවයි. මෙහිදී, නිලධාරීන්ගේ පිටවීමේ සටහනට අදාළව මෙම කොමිෂන් සභාවට ගොනු කර ඇති උද්ධෘත සම්බන්ධව අවධානය යොමු කිරීමේදී, දිනය 2023.10.16 වේලාව 17.55 පිටුව 284 ඡේදය 336 යන ලේඛනය අනුව 2023.10.16 දින පොලිස් ස්ථානයෙන් පිටව ගොස් ඇත්තේ දෙවන, තෙවන, සිව්වන වගඋත්තරකරුවන් තිදෙනා වන බවට නිරීක්ෂණය වේ.

මෙම කොමිෂන් සභාවේ මෙම පැමිණිල්ලට අදාළව සිදු කරන ලද විමර්ශන කටයුතු වලදී, කා.පො.කො. 13067 ධනුෂිකා යන පස් වන වගඋත්තරකාරිය මෙම සිදුවීමට සම්බන්ධ වී ඇත්තේ කුමන අවස්ථාවේදී ද යන්න විමසීමේදී, පළවන වගඋත්තරකරු ලෙස නම් කර ඇති ස්ථානාධිපති නියෝජනය කරමින් ප්‍රකාශයක් ලබා දී ඇති නිලධාරියා විසින් සඳහන් කර ඇත්තේ එදින ජංගම සංචාරයේ යෙදී සිටි නිලධාරීන් විසින් ජීප් රථය යවා පස්වන වගඋත්තරකාරිය ගෙන්වා ගෙන දෙවන පැමිණිලිකාරිය පරීක්ෂා කර ඇති බවයි.

එහෙත් දෙවන, තෙවන. සිව්වන වගඋත්තරකරුවන් විසින් මෙම කොමිෂන් සභාවට ප්‍රකාශයක් ලබා දෙමින් සඳහන් කර ඇත්තේ, පළවන පැමිණිලිකරුගෙන් විමසීමේදී නිවසේ බිරිද සිටින බවට කරුණු අනාවරණය වීම හේතුවෙන් කැස්බෑව පොලිස් ස්ථානයට ගොස් පස්වන වගඋත්තරකාරිය රැගෙන පැමිණිලිකරුවන්ගේ නිවසට ගිය බවයි.

එසේ වුවද, පස්වන වගඋත්තරකාරිය විසින් මෙම කොමිෂන් සභාව වෙත ප්‍රකාශයක් ලබා දෙමින් සඳහන් කර ඇත්තේ, ඇය කිසිම අවස්ථාවක දෙවන පැමිණිලිකාරිය අත්අඩංගුවට ගැනීමට සම්බන්ධ නොවූ බවත්, මෙම සිදුවීම සිදුවූ දිනට පෙරදින එනම්, 2023.10.16 දින පැය 6.00 සිට පැය 18.00 දක්වා රාජකාරි කළ බවත්, පසුව එදින පැය 21.00 ට රාත්‍රී නාමලේඛනයට පෙනී සිට නැවත හට නිවාසයට ගොස් විවේකය ලබා ගත් බවත්, 2023.10.17 දින පැය 6.11 ට නැවත රාජකාරියට වාර්තා කළ බවත් ය.

තවද, 2023.10.17 දින පැය 6.11 ට රාජකාරි වාර්තා කිරීමට පෙර එදින මෙවන් රාජකාරියක් සඳහා යොමුවී තිබේද යන්න විමසීමේදී මෙම කොමිෂන් සභාව වෙත දන්වා ඇත්තේ, එම දින ඇයට කිසිදු දැනුම්දීමක් ලැබී නොමැති බවත්, කිසිදු රාජකාරියක් සඳහා යොමු වී නොමැති බවත්, මෙම සිදුවීම සම්බන්ධව ඇයට දැනගැනීමට ලැබුණේ මුහුණු පොත හරහා බවත් මෙම පැමිණිල්ලේ දෙවන

පැමිණිලිකාරිය ලෙස නම් කර ඇති කාන්තාව ඇය විසින් කිසිදු අවස්ථාවක පරීක්ෂා කිරීමක් සිදු නොකළ බවත් වැඩිදුරටත් දන්වා ඇත.

මෙම පස්වන වගඋත්තරකාරියගේ ප්‍රකාශය අනුව එක සිට හතර දක්වා වගඋත්තරකරුවන් විසින් මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති කාන්තා පොලිස් නිලධාරිණියක් ගෙන්වා දෙවන පැමිණිලිකාරිය පරීක්ෂා කිරීම පිළිබඳව ඉදිරිපත් කර ඇති සාක්ෂි අසත්‍ය බවට මෙම කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරන බැවින් එම සාක්ෂි මෙම කොමිෂන් සභාව විසින් බැහැර කරනු ලැබේ.

තවද මෙම දෙවන පැමිණිලිකාරිය සමග තෙවන පැමිණිලිකරු සහ පළමු පැමිණිලිකරුගේ අනෙකුත් මිතුරා උක්ත වගඋත්තරකරුවන් විසින් අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානය වෙත රැගෙන යනු ලබන්නේ පෙරවරු 3.45 ට පමණ බවට ඉදිරිපත් කර ඇති වීඩියෝ සාක්ෂි අනුව නිරීක්ෂණය වේ. එක සිට හතර දක්වා වගඋත්තරකරුවන්ගේ සාක්ෂි අනුව මෙම දෙවන පැමිණිලිකාරිය පොලිස් ස්ථානයේ රඳවා ගෙන සිටියේ පස්වන වගඋත්තරකාරියගේ භාරයේ බවට ප්‍රකාශ කර ඇති නමුත් පස්වන වගඋත්තරකාරිය විසින් එම කරුණු ප්‍රතික්ෂේප කර ඇත.

තවද, ඉහත කී උද්ධෘත වාර්තාවේ නිලධාරීන්ගේ පැමිණීමේ වේලාව පැය 0615 ලෙස දක්වා තිබුණද, වගඋත්තරකරුවන් විසින් මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි ලබා දෙමින් ප්‍රකාශ කර ඇති වේලාව අනුව මෙම පැමිණිලිකරුවන් පොලිස් ස්ථානයට රැගෙන ගොස් ඇත්තේ 2023.10.17 දින පැය 3.30 – 4.30 අතර වේලාවක බවද නිරීක්ෂණය වේ. එම අවස්ථාවේ පොලිස් ස්ථානයේ කාන්තා පොලිස් නිලධාරිණියක නොසිටි බවට ඉහත සාක්ෂි වලින් අනාවරණය වේ.

ඒ අනුව මෙම දෙවන පැමිණිලිකාරිය වගඋත්තරකාර පොලිස් ස්ථානයේ කාන්තා නිලධාරිණියක හෝ නොමැතිව රඳවා තබා ගෙන තිබුණු බවට කරුණු පැහැදිලි වේ. එසේ කාන්තා නිලධාරිණියක් හෝ නොමැතිව දෙවන පැමිණිලිකාරිය එහිදී රඳවා තබා ගෙන එම පැමිණිලිකාරිය විසින් පොලිස් ස්ථානය අතුගා ගත් බවට සහ එම පැමිණිලිකාරිය සිටි දෙසට කැරපොත්තෙකු දමා හිංසනයට පත් කළ බවට දෙවන පැමිණිලිකාරිය විසින් කරුණු ඉදිරිපත් කර ඇත. මේ පිළිබඳව පළමු පැමිණිලිකරු විසින් දන්වා ඇත්තේ පළමු පැමිණිලිකරු සිරමැදිරියේ සිටි අවස්ථාවේ දෙවන පැමිණිලිකාරිය විසින් කෑ ගහන හඬක් ඇසුනු බවත් මෙම පැමිණිලිකරු ˊˊ මොකද්ද සර් කරන්නේ ˊˊ කියා කෑ ගැසූ බවත් ය.

මෙම චෝදනාව වගඋත්තරකරුවන් විසින් ප්‍රතික්ෂේප කර ඇති අතර අදාළ සමස්ථ කරුණු පිළිබඳ අවධානය යොමු කිරීමේදී එවැනි සිදුවීමක් සිදුවිය හැකි සම්භාවිතාව බැහැර කළ නොහැක.

මෙවැනි අවස්ථාවකදි දෙවන, තෙවන සහ සිවුවන වගඋත්තරකරුවන් විසින් දෙවන පැමිණිලිකාරිය ලවා පොලිස් ස්ථානය අතුගා ගෙන ඇය සිටි දෙසට කැරපොත්තෙක් දමා හිංසා කර ඇති බවට නියත වශයෙන්ම මෙම කොමිෂන් සභාවට නිගමනයකට එළඹිය නොහැකි වුවද කිසිදු කාන්තා නිලධාරිණියක් හෝ නොසිටි අවස්ථාවක එක් කාන්තා පාර්ශවයෙකු අත්අඩංගුවට ගෙන පිරිමි නිලධාරීන් පමණක් සිටින ස්ථානයක එසේ අත්අඩංගුවට ගන්නා ලද කාන්තා පාර්ශවය පමණක් රඳවා

සිටීමෙන් පමණක් එකී කාන්තා පාර්ශවය අපහසුතාවයට පත්වීමට අවස්ථාවන් පවතින අතර ඒ තුළින් එම කාන්තා පාර්ශවය හිංසනයට ද පත්වීමට හැකියාවක් පවතින බවට මෙම කොමිෂන් සභාව නිරීක්ෂණය කර සිටී.

අංක ඒ 20 දරණ පොලිස් දෙපාර්තමේන්තු නියෝගයේ පස්වන වගන්තියේ පහත පරිදි දක්වා ඇත;

> ´´ රදවා ගැනීම (ඒ) සිරභාරයට ගත් තැනැත්තෙකු පොලිස් ස්ථානයකට ගෙනා විට උපසේවා රාජකාරියේ යෙදී සිටින සැරයන් හෝ කොස්තාපල් විසින් භාර ගතයුතු අතර. එතැන් සිට එම තැනැත්තාගේ භාරය ගෙන ඔහු වගකිවයුතු ය. රදවා ගත් අය ස්ත්‍රියක් නම් නෑයෙකු හෝ විශ්වාස කටයුතු පාලිකාවක හෝ ඒ අය සමග සිටිය යුතු ය. ´´

ඉහත සඳහන් පොලිස් දෙපාර්තමේන්තු නියෝග අනුව කාන්තා පාර්ශවයෙකු පොලිස් ස්ථානයක රදවා තබා ගෙන සිටින්නේ නම් එකී කාන්තා පාර්ශවය සමග නෑයෙකු හෝ විශ්වාස කටයුතු පාලිකාවක් හෝ සිටිය යුතු බවට අනිවාර්ය කර ඇත. එසේ වුවද ඉහත ඉදිරිපත් වී ඇති කරුණු අනුව මෙම කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටින්නේ කාන්තාවක් වූ දෙවන පැමිණිලිකාරිය ඉහත සඳහන් වගඋත්තරකරුවන් තිදෙනා විසින් අත්අඩංගුවට ගෙන ඇති වෙලාවේ සිට වගඋත්තරකාර පොලිස් ස්ථානයේ රදවා තබා ගෙන ඇත්තේ ඉහත කී පොලිස් දෙපාර්තමේන්තු නියෝගය උල්ලංඝණය කරමින් බවයි.

එහෙයින් වගඋත්තරකරුවන්ගේ මෙම අත්තනෝමතික ක්‍රියාවලිය හේතුවෙන් මෙම දෙවන පැමිණිලිකාරියගේ 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 12(1) 13 (1) ව්‍යවස්ථාව යටතේ තහවුරු කර ඇති අයිතිවාසිකම් ද උල්ලංඝණ වී ඇති බවට මෙම කොමිෂන් සභාව විසින් නිගමනය කර සිටී.

තවද මෙම දෙවන පැමිණිලිකාරිය සාධාරණ හේතුවක් නොමැතිව අත්අඩංගුවට ගෙන ඉහත සඳහන් පරිදි පොලිස් දෙපාර්තමේන්තු නියෝගය උල්ලංඝණය කරමින් වගඋත්තරකාර පොලිස් ස්ථානයේ රදවා තබා ගෙන හිංසනයට පත් කිරීම තුළින් 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාවේ සඳහන් අවමන් සහගත සැලකිල්ලට යටත් නොකළ යුතුයි යන අයිතිවාසිකම ද උක්ත වගඋත්තරකරුවන් තිදෙනා විසින් උල්ලංඝණය කර ඇති බවට මෙම කොමිෂන් සභාව විසින් නිගමනය කර සිටී.

<u>තෙවන පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමේ නීත්‍යානුකූලභාවය:</u>

මෙහිදී තෙවන පැමිණිලිකරු නීතිවිරෝධී ලෙස අත්අඩංගුවට ගෙන ඇති බවට පැමිණිල්ලේ සඳහන්ව තිබුණද ඒ පිළිබඳව ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කර නොමැති අතර මෙම තෙවන පැමිණිලිකරු විසින් අධිකරණයේදී ඔහුට විරුද්ධව ගොනු කර තිබූ චෝදනාවේ වරද පිළිගෙන දඩ මුදල් ගෙවා නඩු කටයුතු අවසන් කර ඇති බවට නිරීක්ෂණය වන බැවින් මෙම පැමිණිලිකරුගේ අත්අඩංගුවට ගැනීම

සම්බන්ධයෙන් වගඋත්තරකරුවන් ප්‍රකාශ කරන පරිදි තෙවන පැමිණිලිකරු සතුව මත්ද්‍රව්‍ය තිබුණේද නැද්ද යන්න පිළිබඳව මෙම කොමිෂන් සභාව විසින් නිගමනයකට එළඹිය නොහැකිව පවතී.

වගඋත්තරකරුවන් විසින් මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇති උදෘත වාර්තාව හා පැමිණිලි විභාග කිරීමේදී ලබා දී ඇති ප්‍රකාශයන් අනුව 2023.10.16 දින රාත්‍රී සංචාරය සඳහා පිටව ගොස් ඇත්තේ නිලධාරීන් තිදෙනෙකු පමණ බවත්, සිවිල් ඇඳුමින් සිටි පුද්ගලයා එම නිලධාරීන් විසින් හඳුනනු ලබන දෙරණ නාලිකාවේ සේවය කරන පුද්ගලයෙකු බවත් වගඋත්තරකරුවන් විසින් ප්‍රකාශ කර ඇති අතර එම තැනැත්තා දූෂාන් බවට දෙවන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත.

පොලිස් නිලධාරීන් රාජකාරි කරමින් සිටියදී ඒ සඳහා ඔවුන් විසින් ගමන් කිරීමට භාවිතා කරන ලද නිල රථයේ වෙනත් තෙවන පාර්ශවකරුවෙකුද රැගෙන ගමන් කිරීම ඔවුන් සතු බලය අවභාවිතා කිරීමක් වන අතර, ඉහත සඳහන් සිදුවීමට අදාළව පළවන පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති වීඩියෝ සාක්ෂි අනුව, එම තෙවන පාර්ශවය විසින් ජීප් රථයේ පිටුපස දොර අරිමින් පළවන පැමිණිලිකරුට නගින ලෙස හිසෙන් සංඥා කිරීම, ජීප් රථය තුළ තිබෙන මාංචුව ඔහු විසින්ම පොලිස් නිලධාරියාගේ අතට ගෙනවිත් ලබාදීම හා පළවන පැමිණිලිකරු ජීප් රථයට නංවා ගැනීමෙන් පසුවද එම තෙවන පාර්ශවය ජීප් රථයේ ගමන් කිරීමට අවසර දීම යන සියළුම කාරණාවන් පොලිස් නිලධාරීන් ඔවුන් සතු බලය පොලිස් නිලධාරියෙකු නොවන වෙනත් යම් තැනැත්තෙකුට අවභාවිතා කිරීමට සැලැස්වීමක් ලෙස පැහැදිලි ලෙස මෙම කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටී.

තවද පැමිණිලිකරුගේ නිවසට යන අවස්ථාවේ දී ද දෙවන, තෙවන සහ සිව්වන වගඋත්තරකරුවන් සමග ඔවුන්ගේ මිතුරෙකු බවට පවසා ඇති බාහිර පුද්ගලයා ද වගඋත්තරකරුවන් සමග ගමන් කරමින් පැමිණිලිකරුගේ නිවසට යන බව ද C.C.T.V. ඡායාරූප මගින් නිරීක්ෂණය වේ.

මෙහිදී ද, දෙවන, තෙවන සහ සිව්වන වගඋත්තරකරුවන් සිය රාජකාරිය ඉටු කිරීමේදී, බාහිර පුද්ගලයෙකු සම්බන්ධ කරගෙන උක්ත පැමිණිල්ලේ පැමිණිලිකරුගේ නිවස දක්වා යාමට අවස්ථාව ලබාදී ඇති බවට අනාවරණය වේ. වගඋත්තරකරුවන්ගේ මෙවැනි ක්‍රියාවලියක් අත්තනෝමතික ලෙස ඔවුන් සතු බලය අවභාවිතා කිරීමක් බවට මෙම කොමිෂන් සභාවට පෙනී යයි.

තමන් යටතේ සිටින නිලධාරීන් නීතියට අනුව කටයුතු කරන්නේදැයි අධීක්ෂණය කිරීමට උසස් නිලධාරීන්ට යුතුකමක් හා වගකීමක් ඇති බවත් තම අධීක්ෂණයට යටත්වන නිලධාරීන්ගේ හැසිරීම නිරීක්ෂණය කිරීම ඔවුන්ගේ යුතුකමක් බවත් තමා යටතේ සිටින නිලධාරීන් මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කරද්දී එකී නිලධාරීන් වගවීමකට ලක් නොකරන උසස් නිලධාරීන් ද එකී මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමට වගකිවයුතු බවත්, දඬුවම් ලැබීමේ වගකීමකට යටත් පසුබිමක් ඇති කරන බවත් එවැනි නිලධාරීන්ට විනය පියවර නොගැනීම මගින් නීතිය ඉදිරියේ සමානව සැලකීම උල්ලංඝණය කිරීමක් සිදු කරන බවත් තුරෙයිරාජා විනිසුරුතුමා විසින් ඉරේෂා ලක්මාලි

එදිරිව නෙවිල් සිල්වා, කොළඹ අපරාධ කොට්ඨාශය සහ තවත් අය SC/FR/505/19 යන නඩු තීන්දුවේදී දක්වා ඇත.

මෙහිදී පළමු වගඋත්තරකරු වූ එවකට සිටි ස්ථානාධිපති ඉහත පැමිණිල්ලේ සඳහන් අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම සහ වදහිංසාවට ලක් කිරීම යන චෝදනා වලට ඍජුව සම්බන්ධ නොවූවද ඉහත සිදුවීම සිදුවූ දින වනවිට අදාළ පොලිස් ස්ථාන භාරව සිටි ස්ථානාධිපති වන බැවින් සහ තම පොලිස් ස්ථානයේ සිටි නිලධාරීන් සම්බන්ධව සහ අත්අඩංගුවේ සිටින සැකකරුවන් පිළිබඳව නිසි පරිදි අධීක්ෂණ කටයුත්ත සිදු කර ඇති බවට කරුණු අනාවරණය නොවන හෙයින් ආයතන ප්‍රධානියෙකුට ඇති අධීක්ෂණ වගකීම විධිමත් ලෙස ඉටු නොකිරීම හේතුවෙන් මෙම පළමු වගඋත්තරකරු ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාව උල්ලංඝණය කර ඇති බවට කොමිෂන් සභාව විසින් නිගමනය කර සිටී.

තවද මෙම පළමු වගඋත්තරකරු විසින් ඉදිරිපත් කර ඇති උදෘත වාර්තාවේ සඳහන් කරුණු සහ මෙම වගඋත්තරකරු වෙනුවෙන් කොමිෂන් සභාව ඉදිරියේදී පෙනී සිටි නිලධාරියා විසින් ලබාදී ඇති ප්‍රකාශ සහ ඉදිරිපත් වූ අනෙකුත් කරුණු අතර පරස්පරතාවයක් තිබෙන බවටද නිරීක්ෂණය කර සිටී.

මෙම පැමිණිල්ලේ පස්වන වගඋත්තරකාරිය ලෙස නම් කර ඇති කාන්තා පොලිස් නිලධාරිණියට විරුද්ධව පැමිණිලිකරුවන් විසින් කිසිදු පැමිණිල්ලක් ඉදිරිපත් කර නොමැති අතර මෙම පස්වන වගඋත්තරකාර පාර්ශවකාරිය මෙම පැමිණිල්ලේ පරීක්ෂණ කටයුතු සඳහා කැඳවා ඇත්තේ එක සිට හතර දක්වා වූ වගඋත්තරකරුවන් විසින් ඉදිරිපත් කර ඇති කරුණු අනුව වේ.

එසේ කැඳවීමේදී මෙම පස්වන වගඋත්තරකාරිය විසින් පැමිණිලිකරුවන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වන පරිදි කිසිදු කටයුත්තක් සිදු කර නොමැති බවට අනාවරණය වූ අතර ඉහත කී එක සිට හතර දක්වා වූ වගඋත්තරකරුවන්ගේ ඉහත සඳහන් කටයුතු වලදී කිසිදු අවස්ථාවක සම්බන්ධ වී නොමැති බවට ද අනාවරණය වන බැවින් මෙම පස්වන වගඋත්තරකාරිය මෙම කොමිෂන් සභාව විසින් වගකීමෙන් නිදහස් කර සිටී.

## <u>කොමිෂන් සභාවේ නිගමනය</u>

ඉහත සඳහන් කරුණු අනුව පළමු වගඋත්තරකරු විසින් අධීක්ෂණ වගකීම නිසි ලෙස ඉටු කිරීමට අපොහොසත් වීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති මූලික අයිතිවාසිකම් පළමු හා දෙවන පැමිණිලිකරුවන් සම්බන්ධයෙන් උල්ලංඝණය කර ඇති බවටත් දෙවන තෙවන සහ සිව්වන වගඋත්තරකරුවන් විසින් මෙකී සිදුවීමේදී ඔවුන්ගේ නීතියට පටහැනි ක්‍රියාකලාපය මගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11, 12(1) සහ 13(1) යන

ව්‍යවස්ථාවෙන් මගින් තහවුරු කර ඇති මූලික අයිතිවාසිකම් පළමු හා දෙවන පැමිණිලිකරුවන් සම්බන්ධයෙන් උල්ලංඝණය කර ඇති බවට කොමිෂන් සභාව විසින් නිගමනය කර සිටී.

**නිර්දේශය**

01 දෙවන, තෙවන සහ සිව්වන වගඋත්තරකරුවන් විසින් පළමු පැමිණිලිකරු වෙත රු. 25000/- බැගින් වූ මුදලක් ගෙවිය යුතු ය. එසේම අදාළ ගෙවීම් සිදු කර වගඋත්තරකරුවන් විසින් ඒ පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතු ය.

02 දෙවන, තෙවන සහ සිව්වන වගඋත්තරකරුවන් විසින් දෙවන පැමිණිලිකාරිය වෙත රු. 5000/- බැගින් වූ මුදලක් ගෙවිය යුතු ය. එසේම අදාළ ගෙවීම් සිදු කර වගඋත්තරකරුවන් විසින් ඒ පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතු ය.

*<u>පොලිස්පතිවරයා විසින්,</u>*

03 පළමු වගඋත්තරකරු වන ප්‍ර.පො.ප. ඒ.ජේ.එම්. රංජන් සමරසිංහ (හිටපු ස්ථානාධිපති, පොලිස් ස්ථානය, කැස්බෑව), දෙවන වගඋත්තරකරු වන ඔලබොඩුවගේ යසසිරි ගාමිනී අල්විස්, තෙවන වගඋත්තරකරු වන විතාරනගේ ප්‍රභාත් රන්දීර සහ සිව්වන වගඋත්තරකරු වන විජේසූරිය ආරච්චිගේ සචිරු මධුශංක යන අයවළුන් කටයුතු කර ඇති ආකාරය පිළිබඳ පරීක්ෂණයක් පවත්වා සුදුසු විනය පියවර ගතයුතු අතර එසේ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතු ය.

2026. 08 . 28 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම් දියයුතු වන අතර එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සළකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

| | | | |
|---|---|---|---|
| පිටපත | 01 | අමාත්‍යතුමා,<br>මහජන ආරක්ෂක අමාත්‍යාංශය,<br>04වන මහල,<br>සුහුරුපාය, බත්තරමුල්ල | |
| | 02 | ලේකම්,<br>මහජන ආරක්ෂක අමාත්‍යාංශය,<br>04වන මහල,<br>සුහුරුපාය, බත්තරමුල්ල | - ඉහත නිර්දේශය ප්‍රකාරව පියවර ගැනීමට |
| | 03 | පොලිස්පති,<br>පොලිස් මූලස්ථානය, කොළඹ 01 | - ඉහත නිර්දේශය ප්‍රකාරව පියවර ගැනීමට |
| | 04 | සභාපති,<br>ජාතික පොලිස් කොමිෂන් සභාව,<br>අංක 09 ගොඩනැගිල්ල, BMICH පරිශ්‍රය,<br>බෞද්ධාලෝක මාවත, කොළඹ 07 | - අ.ක.ස |
| | 05 | අධ්‍යක්ෂ,<br>පොලිස් මානව හිමිකම් කොට්ඨාශය,<br>මුක්තාර් ප්ලාසා ගොඩනැගිල්ල,<br>ග්‍රෑන්ඩ්පාස්, කොළඹ 15 | - අ.ක.ස |

සැ.යු - අදාල මුදල මුදල් ඇණවුමක් මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සැලැස්විය යුතුය.